ශ්‍රී ලාංකිකයින් සඳහා
සිංහල භාෂාව

# සන්මු නගරයේ ජීවත් වීමේදී

# අවශ්‍ය කරුණු

# දැනුවත් කිරීම

සන්මු නගරයේ ලියාපදිංචි     නගරයේ ජීවත් විමේදී

දැනගතයුතු දෑ පිළිබඳව සරළව පැහැදිළි කර ඇත

【සන්මු නගරයේ ජිවත් විමේදී පරිහරණය සඳහා මාර්ගෝපදේශ අත්පොත】

සන්මු නගරසභාව **2021** වර්ෂයේ අප්‍රේල් මාසයේ සැකසුමකි

**2023** ජනවාරි සංශෝධිත

---

සන්මු වෙබ්අඩවිය→




山武市マスコットキャラクター
SUNムシくん

# පටුන


| අංකය | මාතෘකාව | පිටුව |
|---|---|---|
| 1 | එදිනෙදා ජීවත් වීමේදී අවශ්‍ය වනදෑ | පිටු අංක 1සිට පිටුඅංක 2 |
| 2 | ජපන් භාෂාව ඉගෙනගනිමු. | පිටු අංක 3 සිට පිටු අංක 4 |
| 3 | අසනීපවූ විට, ගින්නක් ඇතිවූ විට, රිය අනතුරක් ඇතිවූවිට, කුමක් කලයුතුද. | පිටු අංක 5 |
| 4 | ස්වභාවික විපතක් ඇතිවූ විට | පිටු අංක 6සිට පිටු අංක 13 |
| 5 | සන්මු නගරයේ පදිංචිවන විට ලිපිනය වෙනස් වන විට කළයුතු දේ | පිටු අංක 14සිට පිටු අංක 16 |
| 6 | සීල්එක ලියාපදිංචි කිරීම / සීල්එක ලියාපදිංචිකළ සහතිකය<br>( *Inkantōroku / Inkantōroku Shōmeisho* )<br>< සීල් එක ( *Hanko* එක ) ලියාපදිංචි කිරීම > | පිටු අංක 17 සිට පිටුඅංක 19 |
| 7 | තාවකාලික අංක තහඩුව ( කරිනම්බා ) ( *Kari Nanbā* ) | පිටු අංක 20 සිට පිටු අංක 21 |
| 8 | පෞද්ගලික අංකය සහිත කාඩ්පත < Mainanbā Kādo > | පිටු අංක 22සිට පිටු අංක 23 |
| 9 | ජාතික සෞඛ්‍ය රක්ෂණය ( *Kokumin Kenkōhoken* ) | පිටු අංක 24 සිට පිටු අංක 27 |
| 10 | බදු වර්ග ( *Zeikin no Shurui* ) | පිටු අංක 28 |
| 11 | ආධායම්බදු සහතිකය ( *Shotoku・Kazei Shōmeisho* ) | පිටු අංක 29 |
| 12 | කරුණාකර බදු ( *Zeikin* ) ගෙවන්න | පිටු අංක 30සිට පිටු අංක 32 |
| 13 | කුණුකසළ ආදිය ඉවත දැමීමේ දී පිළිපැදියයුතු නීතිරීති | පිටු අංක 33 සිට පිටු අංක 35 |
| 14 | නිවසේ ඇති කුණුකසළ (නිවසේ එක්කාසුවනකුණු ) ඉවතලන ආකාරය < නරුතෝ ප්‍රදේශය > | පිටු අංක 36 සිට පිටු අංක 47 |
| 15 | නිවසේඇති කුණුකසළ < නිවසේ එක්කාසුවනකුණු > ඉවතලන ආකාරය ( සම්බු ප්‍රදේශය, හසුණුම ප්‍රදේශය, මත්සුඹ ප්‍රදේශය ) | පිටු අංක 48සිට පිටු අංක58 |
| 16 | දරු ප්‍රසූතිය සිදුකළ මවක් ,දරුවෙක් ගැබ්ගත් මවක්,කළයුතු දෑ | පිටු අංක 59සිට පිටු අංක 68 |
| 17 | දරුවන් සදාවඩා ගැනීම ❶ | පිටු අංක 69සිට පිටු අංක 70 |
| 18 | දරුවන් සදාවඩා ගැනීම ❷ | පිටු අංක 71 සිට පිටු අංක72 |
| 19 | දරුවන් ප්‍රාථමික පාසලට සහ කණිෂ්ඨ උසස්පාසැලට ඇතුළත් කරන විට කළයුතු දෑ | පිටු අංක 73සිට පිටු අංක 74 |
| 20 | පිළිකා පරීක්ෂණය・ශරීරය පරික්ෂා කිරීම! | පිටු අංක 75සිට පිටු අංක 77 |
| 21 | ඉඩම් පරිහරණය කිරීමේදී උපදෙස් | පිටු අංක 78 |
| 22 | වැසිකිළි භාවිතයේදී අනුගමනය කලයුතු දෑ | පිටු අංක 79සිට පිටු අංක 81 |
| 23 | බල්ලෝ සහ පූසෝ | පිටු අංක 82සිට පිටු අංක 83 |
| 24 | මෙවැනි අවස්ථාවක  කුමක් කළයුතුද? | පිටු අංක 84සිට පිටු අංක 93 |


※ අමාරු වචන යටින් ඉරිඇද ඇත. පිටුවේ අවසානයේදී අමාරු වචන පිළිබදව පැහැදිළිව සදහන් කර ඇත.

# 1 එදිනෙදා ජීවත් වීමේදී අවශ්‍ය වනදෑ

මෙම මාර්ගෝපදේශ අත් පොත සන්මු නගරයේ පදිංචි වී සිටින විදේශිකයන් සඳහා,  සකස් කරන ලදී.
සාමාන්‍ය ජීවිතයේදී අවශ්‍ය වන කරුණු පිළිබඳව විස්තරාත්මකව මෙහි පැහැදිලි කර ඇත.
සන්මු නගරයේ සතුටින් කාලය ගත කිරීම සඳහාත්,  දෛනික ජීවිතයේ අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම උදෙසාත් මෙම අත් පොත ඔබට ප්‍රයෝජනවත් වනු ඇත.

- දෛනික ජීවිතයේදී අවශ්‍යතාවයන්

## ① කුණුකසළ ඉවත දමන ආකාරය




ඉවතලන කුණු වර්ග කීපයක් ඇත.
ඒ් ඒ් කුණු වර්ගයට අනුව,  කුණු ඉවතට දැමීමේදී කුණු දමන කවර එකිනෙකට වෙනස්කමක් දක්වයි.
කුණු වර්ගය අනුව විවිධ වර්ගයේ කුණු ඉවතලන දවස් ද එකිනෙකට වෙනස් වේ.
මාර්ග දෙපස හෝ මාර්ගය මත කුණුකසළ දැමීමෙන් වලකින්න.
කරුණාකර මෙම නීතිරීති පිළිපදින්න. ( 33 වෙනි පිටුවේ සිට 58 වන පිටුව දක්වා කරුණාකර කියවන්න )

## ② උස් හඬ නගා ශබ්ද කිරීමෙන් වලකින්න



නිවසේ සිටින විට උස් හඬක් ඇසෙන ආකාරයෙන් සිංදු දැමීමෙන් වලකින්න.
ඔබගේ නිවසට ආසන්නවම පිහිටා ඇති නිවසට හාදා පැමිණෙන ආකාරයෙන් විශාල ලෙස ශබ්ද නගා කථාබහ කිරිමෙන් වලකින්න.
ඔබගේ නිවසත් අසල් වාසීන්ගේ නිවසත් ඉතා ළඟින් පිහිටා තිබෙන විට, විශාල ශබ්ද සහ කථාබහකරන හඬ ඇසේ.
අසල්වාසී නිවසට ඉතා ළඟින් ඔබගේ නිවස පිහිටා ඇති විට, කරුණාකර ඔවුන්ට බාධා පැමිණෙන ලෙස හැසිරිමෙන් වලකින්න.

## ③ රාත්‍රී කාලයේදී නිශබ්දව හැසිරෙන්න



සන්මු නගරය ඉතා නිස්කලංක නගරයකි.
රාත්‍රී කාලය ලබනවිට ඉක්මනින්ම නින්දට යන පුද්ගලයෝ සිටිති.
නිවසින් පිටත සිටින විටද අන්අයට කරදරයක් නොවන ආකාරයෙන් හැසිරෙන ලෙස ප්‍රවේසම් වන්න.
නිවාස ඇතුළතද කරුණාකර  නිශ්‍යබ්ද ව සිටින්න.

## ④ වාහන නැවතුම්පොළේ වාහනය නවතා තබන්න



පාරේ වාහන නවත්වනවිට අහලපහල ජීවත්වන අයට බාධා පැමිණේ.
පාරේ වාහන නවත්වා තැබීම ඉතාමත්ම භයානක කාර්යයකි.කරුණාකර වාහන නැවත්වීම සඳහා වෙන්කර ඇති වාහන නැවතුම්පළේ වාහන නවතා තබන්න.


## ⑤ <u>ප්‍රාදේශීය ගම්සභා ( *Ku / Jichikai* )</u>

ඔබ පදිංචි වී සිටින නිවස ආසන්නයේ <u>ප්‍රාදේශීය ගම්සභා ( *Ku / Jichikai* )</u> වක්ඇත.
කරුණාකර අසල්වාසීන් සමග කථාබහ කර ඔවුන් සමග අන්‍යෝන්‍ය
සම්භන්ධතා පවත්වාගන්න.




## ⑥ ඔබගේ නිවසේ නාමපුවරුවක් ( *Hyosatsu* ) සකසා ගන්න.

නගර සභාවේ සිට ඔබට ඉතා වැදගත් ලිපි එවනු ලබනවා.
ලියුම් බහාලන නාම පුවරුවක් නිවසේ සකසා ගන්න.
ලියුම් බහාලන නාම පුවරුව ( *Hyosatsu* ) නිවසේ පදිංචි වී සිටින පුද්ගලයින්ගේ නම
ලියා නිවසේ ඉදිරිපිට සකසා තබන්න.



◎ 1 වෙනි සහ 2 වෙනි පිටුවල අමාරු වචන ◎

※කුණුකසළ ඉවත දමන ආකාරය : කුණුකසළ ඉවත දැමීමේදී පිළිපැදියයුතු නීතිරීති බොහොමයක් ඇත.
33 පිටුවේ සිට 58 පිටුව දක්වා කරුණු කියවා බලන්න.

※ප්‍රාදේශීය ගම්සභා ( *Ku / Jichikai* ) : ප්‍රදේශවාසීන් එක්කාසු වි සුහද සාකච්චා පවත්වන ස්ථානය.

| වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම ) | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| මහජන සහසම්භන්ධතා උපකාරක අංශය ( *Shiminjichi Shienka* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-Shi ) කවුළු අංක㉑ | 0475-80-0151 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා උදේ වරුවේ 8.30 සිට සවස 5.00 දක්වා

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 2 ජපන් භාෂාව ඉගෙනගනිමු.

පහත සදහන් ස්ථාන වලදී ජපන් භාෂාව ඉගෙනීමට හැකියාව ඇත.

● ජපන් භාෂාව උගන්වන ස්ථාන

| නම | **සකුරා ජපන් භාෂා පංතිය** | **නරුතෝ ජපන් භාෂා පංතිය** |
|---|---|---|
| කවදාද ? | සෑම සතියකම සෙනසුරාදා<br>(මාසයේ 5වෙනි සතියේ පංති පවත්වනු නොලැබේ) | සෑම සතියකම සෙනසුරාදා |
| වෙලාව ? | පස්වරු 1 .30සිට<br>පස්වරු 3 දක්වා | පස්වරු 3 සිට<br>පස්වරු 5 දක්වා |
| කොහෙද ? | නරුතෝ චූඕ කෝමින්කන් | නරුතෝ චූඕ කෝමින්කන් |
| වැයවන මුදල | මාසික ගාස්තුව යෙන් 500ක් පමණයි | යෙන්1,000／එක වාරයක් සදහා |
| දුරකථන අංකය | 090-2245-8233 | 090-6128-5251 |
| මේල් | toshiko8233@gmail.com | |
| වෙබ් අඩවිය | | https://naruto-jp-class.jimdofree.com |






— සටහන් —





නරුතෝ චූඕ කෝමින්කන් ( නරුතෝ මද්‍යම මහජන ශාලාව ) *Narutō ChūōKōminkan*
( ස්ථානය ) 262-1 ත්සුබෙ සන්මුනගරය ( 262-1 ,Tsube,Sammu-Shi )

| වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම් ) | ලිපිනය | දුරකථන අංකය |
| --- | --- | --- |
| මහජන සහ සම්භන්ධතා උපකාරක අංශය ( *Shiminjichi Shienka* ) | 296 බන්චි,තොනොදයි, න්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක㉑ | 0475-80-0151 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා උදේ 8.30සිට හවස 5.15 දක්වා

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 3 අසනීපවූ විට, ගින්නක් ඇතිවූ විට, රිය අනතුරක් ඇතිවූවිට, කුමක් කලයුතුද

ඔබට ශරීරයේ අපහසු තාවයක් ඇතිවී අසනීප වූවිට, කරුණාකර අංක 119 ට දුරකථයෙන් අමතන්න.
ගින්නක් ඇතිවූ විට කරුණාකර අංක 119 ට දුරකථයෙන් අමතන්න.
මහාමාර්ග හදිසි අනතුරක් ඇතිවූ විට අංක 110 ට දුරකථනයෙන් අමතන්න.
මුදල් අයවීමක් නොමැත. කුමන අවස්ථාවක වුනත් දුරකථනයෙන්ඇමතිය හැක.
දුරකථන ඇමතුමකදී  කරුණාකර පහත සඳහන් ආකාරයට කථාකරන්න.

## (1) හදිසියේ අසනීප වූ විට සහ තුවාල සිදුවුණු අවස්ථාවකදී

කරුණාකර අංක 「 119 」 ට දුරකථන ඇමතුමක් දෙන්න. ඇම්බියුලන්ස් එක ( *Kyūkyūsha* ) ඔබ ළඟට පැමිණේ.දුරකථනයෙන් පැවසීමේදී පහත සඳහන් ආකාරයට සඳහන් කරන්න.

① 「 ශරීරයේ තත්වය හොඳමදි 」 ( අසනීපයි ・ තුවාල වුණා )
② එම අවස්ථාවේදී ඔබ සිටින ස්ථානය?
③ අසනීප වූ පුද්ගලයාගේ වයස,ගැහැණු පිරිමි බව ( පිරිමිහෝ ගැහැණු )
④ කාට කුමක් වුනාද යනවග
⑤ ඔබගේ නම සහ දුරකථන අංකය



## (2) ගින්නක් ඇතිවූ විට

කරුණාකර 「 119 」 දුරකථන අංකයට අමතන්න.එවිට ගිණිනිවන රථය ( *Shōbōsha* ) එම ස්ථානයට පැමිණේ.දුරකථනයෙන් අමතන විට කරුණාකර පහත සඳහන් දෑ පවසන්න.

「 ගින්නක් ඇවිළී ඇත 」

① ගින්න ඇවිළී පිළිස්සී තිබෙන ස්ථානය පිළිබඳව
② පිළිස්සී තිබෙන දෑ පිළිබඳව
③ තුවාල වූ අය සිටිනවාද?එයින් බේරෙන්න බැරිවුන අය සිටිනවාද? යන්න
④ ඔබගේ නම සහ දුරකථන අංකය



## (3) මහාමාර්ග රිය අනතුරක් ඇතිවුන අවස්ථාවේදී

「 110 」 අංකයට අමතන්න. පොලිස් නිළධාරීන් ( *Keisatsukan* ) පැමිණේ.
දුරකතනයෙන් පහත සඳහන් ආකාරයට සඳහන් කරන්න.

① 「රිය අනතුරක් ඇතිවුණා 」
② කවදා රියඅනතුර සිදුවූවාද? යන්න
③ කොහේදී රියඅනතුර සිදුවූවාද? යන්න
④ තුවාල වී සිටින අය ඉන්නවාද?
⑤ ඔබගේ නම සහ දුරකථන අංක





◎ 5 වෙනි පිටුවේ අමාරු වචන ◎

※ඇම්බියුලන්ස් එක ( *Kyūkyūsha* ) : තුවාල වූ අය සහ අසනීප වූවන් රෝහලට ගෙනයන වාහනය
※ගිණි නිවන වාහනය ( *Shōbōsha* ) : ගින්නක් ඇතිවූවිට ගින්දර නිවන වාහනය
※පොලිස් නිළධාරීන්( *Keisatsukan* ) : පොලිස්කාරයෝ ( *Keikan* )

# 4 ස්වභාවික විපතක් ඇතිවූ විට  කුමක් කළයුතුද?

ජපානයේ භූමිකම්පා, <u>ත්සුනාමි ( *Tsunami* )</u>, <u>ගංවතුර ( *Kōzui* )</u>, නායායෑම්ආදී <u>ස්වභාවික විපත් ( *Saigai* )</u> බොහෝ තිබෙනවා.

<u>ස්වභාවික විපත් ( *Saigai* )</u> ඇතිවූ විට කරුණාකර එම ස්ථානයෙන් බැහැර විය යුතුයි.

තවද,<u>ස්වභාවික විපත් ( *Saigai* )</u> ඇතිවූවිට පහත සදහන් (1)සිට (4)දක්වා දෑ අනුගමනය කළයුතුයි.

ඔබගේ ආරක්ෂාව සදහා 8 වෙනි පිටුවේ සහ 11 වෙනි පිටුවේ සටහනේ සදහන්කර ඇති ආරක්ෂක ස්ථානවලට කරුණාකර පිටවී යන්න.

රේඩියෝව වැනි උපකරණයකි ( <u>*Bōsai Gyōsei Musen*</u> )



## (1) හදිසි ආපදා පළිබදව විවිධ විස්තර දැනගැනීම සදහා

① <u>රේඩියෝව වැනි උපකරණයකි ( *Bōsai Gyōsei Musen* )</u>

නගරයේ ඇතිවන <u>හදිසි ආපදා</u>, පිළිබදව ප්‍රචාරයකිරීමේදී විවිධ විස්තර ශ්‍රවණය කිරීමට හැකි යන්ත්‍රයකි.

② වෙබ් අඩවිය ( *Kishōchō* )

<u>ස්වභාවික විපත් ( *Saigai* )</u> පිළිබදව විවිධ රටවල භාෂාවෙන් කියවා බලාගැනීමේ හැකියාව ඇත.

https://www.jma.go.jp/jma/index.html

③ <u>සන්මු නගරයේ ( *Hazādo mappu* )</u>

සන්මු නගරයේ නගරසභාවේ වෙබ් අඩවියට පිවිසී ඔබට එය ඩවුන්ලෝඩ් කරගැනීමේ හැකියාව ඇත. නගරසභා කාර්යාලය < ගිණිගැනීම් හා ආපදා වැළක්වීමේ අංශය ( *Shōbō Bōsaika* )> සහ නගර සභාවේ අනුශාකා වලින්ද ලබාගත හැක.

තමන් පදිංචි වී සිටින ප්‍රදේශයේ ඒ ඒ ස්ථානවල කුමන ආකාරයේ අවදානම් ස්ථානයන් තිබේද යනවග සදහන් කරඇත. ( සුනාමියක් ඇතිවූ විට කොපමණ ප්‍රමාණයකට ජලගැලීමක්සිදුවේද යනවග,මෙහි සදහන්කර ඇත.ප්‍රවේසම් විය යුතු දුර ප්‍රමාණයන් ආදිය සදහන් කර ඇත. )

නගර සභාවේ වෙබ් අඩවියට පිවිසෙන ආකාරය

https://www.city.sammu.lg.jp/page000786.html

(සන්මු නගරයේ *Hazādo mappu*)









④ <u>හදිසියේම ඇතිවන භූමිකම්පා පිළිබද එම මොහොතේම දැනුම්දීම ( *Kinkyū Jishin Sokuhō* )</u>

භූමිකම්පාවක් ඇතිවූ විට ශබ්දයක් හටගනී .එවිට හැකි ඉක්මනින් ආරක්ෂාකාරී ස්ථානයකට යායුතුය.
විශාල භූමිකම්පාවක් පැමිණි අවස්ථාවලදී ත්සුනාමියක් හටගැනීමේ හැකියාව ඇත.
හැකි ඉක්මනින් ආරක්ෂාකාරී උස් ස්ථානයකට යන්න.
ජංගම දුරකථන සහ ස්මාට් දුරකථන වලින්ද හදිසියේ ඇතිවන භූමිකම්පාවන් පිළිබදව දැනගැනීමේ හැකියාව ඇත.

---

◎ 6 වෙනි පිටුවේ සිට 7 වෙනි පිටුව දක්වා අමාරු වචන◎

※<u>ස්වභාවික විපත් ( *Saigai* )</u> : භූමිකම්පා,විශාල වැසි ඇති වීමෙන් ගෙවල්,වතුපිටි,සහ මිනිසුන්ට හානි සිදුවීම

※<u>ත්සුනාමි ( *Tsunami* )</u> : බෙහෙවින්ම විශාල මුහුදු රළ හට ගැනීමෙන් ත්සුනාමි හටගනී.

※ජලගැලීම් (ගංගා පිටාර ගැලීම් )( *kōzui* ) : ගගේ ජලය පිටාර ගොස් ජලයෙන් වතුපිටි යටවී යෑම

※රේඩියෝව වැනි උපකරණයකි ( *Bōsai Gyōsei Musen* ) : සන්මු නගරයේ ඇතිවන හදිසි ආපදා සහ හදිසි අවස්ථා වලදී නගරවාසීන්ට දැනගැනීම පිණිස තොරතුරු ප්‍රචාරය කරනු ලබන අතර, එම විස්තර මෙමෙ රේඩියෝවෙන් ඇසීමට හැකියාව ඇත.

※සන්මු නගරයේ ( *Hazādo mappu* ) : මෙම සිතියම සන්මු නගර සභාවෙන්ලබාගත හැක.සන්මු නගරයේ ඇති අවදානම් ස්ථාන පිළිබදව මෙහි සදහන් කර තිබේ.

※හදිසියේම ඇතිවන භූමිකම්පා පිළිබද එම මොහොතේම දැනුම්දීම ( *Kinkyū Jishin Sokuhō* ) : කාළගුණ විද්‍යා කාර්යාංශය විසින් නිකුත් කරනු ලබන විස්තර. විශාල භූමිකම්පාවක් ඇතිවූ විට විශාල ශබ්දයක් හටගනී.

※නායයෑම් ( *Dosha Saigai* ) : භූමිකම්පා සහ වර්ෂාවෙන් කදු මුදුනේ සිට ගල් සහ මඩ වතුර බහුල ලෙස ගලාගෙන පහතට වැටීම.

## (2) කරුණාකර ආරක්ෂක ස්ථාන වලට පිටවී යන්න

ඔබගේ නිවසට ආසන්නයෙන්ම පිහිටුවා ඇති ආරක්ෂක ස්ථානය වෙත පිටවී යන්න.

යම් ව්‍යසනයකින් ආරක්ෂා වීමේදී යායුතු ස්ථාන පිළිබඳව, ආපදා වලක්වාලීමේ පරිපාලන ගුවන්විදුලිය ( *Bōsai Gyōsei Musen* ) මගින් නගර සභාවේ ප්‍රචාරක සේවය ඔස්සේ සහ, සන්මු නගර සභාවේ පණිවිඩ , විද්‍යුත් ජාලය ඔස්සේ ( *Sammushi Anshin Anzen Mēru* ) මෙම මේල් මගින් බෙදාහරිනු ලැබේ.

පහත සදහන් සටහනේ ඔබගේ නිවසට ආසන්නයේම ඇති ආරෂක ස්ථාන පිළිබඳව සටහන් කර තිබේ.

### 〈 හදිසි අවස්ථාවකදී ආරක්‍ෂාවපතා නම්කර ඇති ස්ථාන 〉

| ප්‍රදේශය | ව්‍යසන වලදී ආරක්ෂාවපතන ස්ථාන ( ආරක්ෂක ස්ථාන ) | ලිපිනය | නගරයේ නම් කර ඇති ආරක්ෂක ස්ථාන පිළිබඳව | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | භූමිකම්පා | ත්සුනාමි | විශාල ගිණි ගැනීම් | ගංවතුර නායයෑම | නවාතැන් පහසුකම් සහිත සාමාන්‍ය ආරක්ෂක ස්ථාන |
| නරුතෝ | නරුතෝ ප්‍රාථමික පාසැල ( *Narutō Shōgakkō* ) | 2692,නරුතෝ,සන්මු නගරය ( 2692,Narutō,Sammu-shi ) | ○ | | | ○ | ○ |
| | ඕතමි ප්‍රාථමික පාසැල ( *Ōtomi Shōgakkō* ) | 60, නිඉනොමිතො,සන්මු නගරය ( 60,Niinomi to,Sammu-shi) | ○ | | | ○ | ○ |
| | නංගෝ ප්‍රාථමික පාසැල ( Nangō Shōgakkō ) | 884-1,මියෝකොජි,සන්මු නගරය ( 884-1,Kamiyokoti,Sammu-shi ) | ○ | ○ | | ○ | ○ |
| | නරුහම ප්‍රාථමික පාසැල ( *Naruhama Shōgakkō* ) | 1090,මොතොසුකා,සන්මු නගරය ( 1090,Motosuka,Sammu-shi ) | ○ | ○ | | ○ | ○ |
| | මිදොරිමි ප්‍රාථමික පාසැල ( *Midorimi Shōgakkō* ) | 471-1,මත්සුගයාරො,සන්මු නගරය (471-1,Matugaya ro,Sammu-shi ) | ○ | ○ | | ○ | ○ |
| | නරුතෝ ද්විතික පාසැල ( *Narutō Chūgakkō* ) | 567,වදා,සන්මු නගරය ( 567,Wada,Sammu-shi ) | ○ | | | ○ | ○ |
| | නරුතෝ හිගෂි කණිෂ්ඨ උසස් පාසැල ( *Narutō Higashi Chūgakkō* ) | 452-1,ගොකිතා,සන්මු නගරය ( 2452-1,Gokita,Sammu-shi ) | ○ | ○ | | ○ | ○ |
| | ශිරහතා ගෘහස්ථ ක්‍රීඩාංගනය ( *Shirahata Taiikukan* ) | 1885,ශිරහතා,සන්මු නගරය ( 1885,Sirahata,Sammu-shi ) | | | | ○ | ○ |
| | නරුතෝ සෝගෝ ක්‍රීඩාංගනය ( *Narutō Sōgō Undō Kōen* ) | 3241, ගොකිතා,සන්මු නගරය ( 3241,Gokita,Sammu-shi ) | ○ | ○ | ○ | ○ | |
| | නරුතෝ මහා විද්‍යාලය ( *Chiba Kenritsu Narutō Kōtō Gakkō* ) | 3596,නරුතෝ,සන්මු නගරය ( 3596,Narutō,Sammu-shi ) | | | | ○ | ○ |

| ප්‍රදේශය | ව්‍යසන වලදී ආරක්ෂාවපතන ස්ථාන ( ආරක්ෂක ස්ථාන ) | ලිපිනය | නගරයේ නම් කර ඇති ආරක්ෂක ස්ථාන පිළිබඳව | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | භූමිකම්පා | ත්සුනාමි | විශාල ගිණි ගැනීම | ගංවතුර නායයෑම | නවාතැන් පහසුකම් සහිත සාමාන්‍ය ආරක්ෂක ස්ථාන |
| සන්බු | මුත්සුඔකා ප්‍රාථමික පාසැල ( *Mutsuoka Shōgakkō* ) | 771, හනියා,සන්මු නගරය ( 771,Haniya,Sammu-shi ) | ○ | | | ○ | ○ |
| | ( පැරණි ) හියුගා ප්‍රාථමික පාසැල ( *(Kyū) Hyūga Shōgakkō* ) | 10,අමෙත්ස්බෝ,සන්මු නගරය ( 10,Ametsubo,Sammu-shi ) | ○ | | | ○ | ○ |
| | සන්බු කිතා ප්‍රාථමික පාසැල ( *Sanbu Kita Shōgakkō* ) | 699, ඔකිවතෂි,සන්මු නගරය ( 699,Okiwatashi,Sammu-shi ) | ○ | | | ○ | ○ |
| | ( පැරණි )සන්මු නිෂි ප්‍රාථමික පාසැල ( *(Kyū) Sanbu Nishi Shōgakkō* ) | 13, ඕගි,සන්මු නගරය ( 13,Ōgi,Sammu-shi ) | ○ | | | ○ | ○ |
| | සන්බු කණිෂ්ඨ උසස් පාසැල ( *Sanbu Chūgakkō* ) | 1885,හනියා,සන්මු නගරය ( 1855,Haniya,Sammu-shi ) | ○ | | | ○ | ○ |
| | හියුගා ප්‍රාථමික පාසැල ( *Hyūga Shōgakkō* ) | 2370, කිබරා,සන්මු නගරය ( 2370,Kibara,Sammu-shi ) | ○ | | | ○ | ○ |
| | සන්බුනො මොරි මධ්‍යම රැස්වීම් ශාලාව ( *Sanbu no Mori Chūō Kaikan* ) | 1904-3,හනියා,සන්මු නගරය ( 1904-3,Haniya,Sammu-shi ) | ○ | | | ○ | ○ |
| | සන්මු මොරි උද්‍යානය ( *Sambu no Mori Kōen* ) | 1904-5, හනියා,සන්මු නගරය ( 1904-5,Haniya,Sammu-shi ) | ○ | | ○ | ○ | |
| මත්සුඕ | හසුණුමා ප්‍රාථමික පාසැල ( *Hasunuma Shōgakkō* ) | 2784,හසුණුමා ඉ,සන්මු නගරය ( 2784,Hasunuma i,Sammu-shi ) | ○ | ○ | | ○ | ○ |
| | ( පැරණි ) හසුණුමා කණිෂ්ඨ උසස් පාසැල ( *(Kyū) Hasunuma Chūgakkō* ) | 1036, හසුණුමා හ,සන්මු නගරය ( 1036,Hasunuma ha,Sammu-shi ) | | ○ | | | ○ |
| | හසුණුමා සහ සම්භන්ධතා මධ්‍යස්ථානය ( *Hasunuma Kōryū Sentā* ) | 4832 -3,හසුණුම හා,සන්මු නගරය ( 4832-3,Hasunuma ha, Sammu-shi ) | ○ | ○ | | ○ | ○ |
| | හසුණුමා ක්‍රීඩා මධ්‍යස්ථානය ( *Hasunuma Supōtsu Puraza* ) | 5402-1 හසුණුමා හ,සන්මු නගරය ( 5402-1,Hasunuma ha, Sammu-shi ) | ○ | ○ | ○ | ○ | ○ |

| ප්‍රදේශය | ව්‍යසන වලදී ආරක්ෂාව පතන ස්ථාන ( ආරක්ෂක ස්ථාන ) | ලිපිනය | නගරයේ නම් කර ඇති ආරක්ෂක ස්ථාන පිළිබඳව | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | භූමික ම්පා | සුනාමි | විශාල ගිණි ගැනීම් | ගංවතුර නායයෑම | නවාතැන් පහසුකම් සහිත සාමාන්‍ය ආරක්ෂක ස්ථාන |
| මත්සුඔ | මත්සුඔ ප්‍රාථමික පාසැල ( *Matsuo Shōgakkō* ) | 383, මත්සුඔ මචි, සරුඔ සන්මු නගරය ( 383,Matsuomachi saruo, Sammu-shi ) | ○ | | | ○ | ○ |
| | තෝයෝකා ශාරීරික ක්‍රීඩාංගනය ( *Tōyooka taiikukan, Matsuo Kodomoen* ) | 441, මත්සුඔමචි,කන්නෝ සන්මු නගරය ( 441,Matsuomachi kannoo, Sammu-shi ) | ○ | | | ○ | ○ |
| | ඕහිරා ප්‍රාථමික පාසැල ( *Ōhira Shōgakkō* ) | 1140, මත්සුඔ මචි, හිරෝනේ සන්මු නගරය ( 1140,Matsuomachi hirone, Sammu-shi ) | ○ | ○ | | ○ | ○ |
| | සන්මු බෝයෝ කණිෂ්ඨ උසස් පාසැල (*Sammu Bōyō Chūgakkō*) | 112, මත්සුඔමචි, මත්සුඔ සන්මු නගරය ( 112,Matsuomachi matsuo, Sammu-shi ) | ○ | | | ○ | ○ |
| | මත්සුඔ ක්‍රීඩාංගනය ( *Matsuo Undō Kōen* ) | 208, මත්සුඔමචි, ෆුජිමිදයි,සන්මු නගරය ( 208-8,Matsuomati hujimidai, Sammu-shi ) | ○ | | ○ | ○ | |
| | ග්‍රාමීය පරිසර වැඩිදියුණු කිරීමේ මද්‍යසථානය (*Nōson Kankyō Kaizen Sentā* ) | 47-3, මත්සුඔමචි,මත්සුඔ,සන්මු නගරය ( 47-3,Matsuomachi matsuo, Sammu-shi ) | ○ | | | ○ | ○ |
| | මත්සුඔ මහා විද්‍යාලය ( *Chibakenritsu Matsuo Kōtō Gakkō*) | 546, මත්සුඔ මචි, ඕත්සුත්සුමි,සන්මු නගරය ( 546,Matsuomachi ōtsutsumi, Sammu-shi ) | | | | ○ | ○ |
| හසුණුම | හසුණුම ගාඩ්න් හවුස් මරිනෝ හෝටලය ( *Hasunuma Garden House Marino*) | 311, ශිහසුබෝ, සන්මු නගරය ( 311,Hasunuma ho,Sammu-shi ) | | ○ | | | |
| | නමිකවාසෝ හෝටලය ( *Namikawasō Hotel*) | 4665, හසුණුම නි ,සන්මු නගරය ( 4665,Hasunuma ni,Sammu-shi ) | | ○ | | | |

| ප්‍රදේශය | ව්‍යසන වලදී ආරක්ෂාවපතන ස්ථාන ( ආරක්ෂක ස්ථාන ) | ලිපිනය | නගරයේ නම් කර ඇති ආරක්ෂක ස්ථාන පිළිබඳව | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | භූමිකම්පා | ත්සුනාමි | විශාල ගිණි ගැනීම් | ගංවතුර නායායෑම | නවාතැන් පහසුකම් සහිත සාමාන්‍ය ආරක්ෂක ස්ථාන |
| හසුණුම • නරුතෝ | වැඩිහිටි නිවාසය ( *Yūryō Rōjin Hōmu Ekuserushiōru Sammu* ) | 3841-70,මොතොසුකා,සන්මු නගරය ( 3841-70,Motosuka,Sammu-shi ) | | ○ | | | |
| | සී සයිඩ් හෝටලය කුජිකුරි ( *Seaside Hotel Kujūkuri* ) | 3701, මොතොසුකා,සන්මු නගරය ( 3701,Motosuka, Sammu-shi ) | | ○ | | | |
| | තෙන්දා විලා කුජිකුරි මහල්නිවාස ( *Tendāvira Kujūkuri* ) | 5025-3,යකතා, යොකොෂිබාහිකරිමචි ( 5025-3,Yakata, Yokoshibahikari-machi ) | | ○ | | | |
| | ඉනොඋචි සුනාමි ආරක්ෂක කලාපය ( *Inouchi Tsunami Hinan Hiroba* ) | 957,ඉනොඋචි, සන්මු නගරය ( 957,Inouchi,Sammu-shi ) | | ○ | | | |
| | කිදෝ ත්සුනාමි කුළුණ 1සහ 2 ( *Kido Tsunami Hinan Tawā 1 & Tawā 2* ) | 848, කිදෝ,සන්මු නගරය ( 848,Kido,Sammu-shi ) | | ○ | | | |

(※) ත්සුනාමියක් ඇතිවුණවිට උස් ස්ථානයකට පැනයන්න. ගොඩනැගිල්ලේ උඩුමහලට යන්න.

- නගරයේ නම් කර ඇති ආරක්ෂක ස්ථාන පිළිබඳව : ව්‍යසනයක් ඇතිවුන අවස්ථාවේදී එයින් බේරීම සඳහා රැදී සිටීමට නම්කර ඇති ස්ථානය.
- ව්‍යසන අවස්ථාවලදී දින කීපයක් ආරක්ෂාව පතා නැවතී සිටීමට හැකි ආරක්ෂක ස්ථාන : ආරක්ෂක ස්ථානයක් ලෙස නගරයේ නම් කර ඇති ස්ථානයක් වන අතර,මෙම ස්ථානවල දින කීපයක්ම ඔබගේ ආරක්ෂාව පතා නැවතී සිටිය හැක.

## (3) පහත සඳහන් අවස්ථා වලදී ඉක්මනින්ම එම ස්ථානයෙන් ඉවත්වන්න

① නගර සභාවේ සිට 「 ආරක්ෂක ස්ථාන වෙත යන්න 」 යැයි දැනුම් දීමක් ලැබුණු විට.
② විශාල වැසි, ත්සුනාමි සහ නායායෑම් ඇතිවීමට ඉඩකඩ ඇති බව දැනගත් අවස්ථාවකදී
③ ස්වභාවික විපතකින් ඔබේ නිවසට හානිවන අවස්ථාවක
④ ඔබගේ නිවසේ ගින්නක් ඇතිවූ විට
⑤ අසල්වාසි නිවසට ගින්නක් ඇතිවී ඔබගේ නිවසද ගිණි ගැනීමට ඉඩකඩ ඇතිඅවස්ථාවක



## (4) නිවසින් පිටවීමට පෙර පහත සදහන් ආකාරයට නීතිරීති පිළිපදින්න




① ලිප් අවුලා ඇති විට කරුණාකර ගින්දර නිවා දමන්න.
② නිවසින් පිටවී යනවිට කරුණාකර ගෑස් නිවා යන්න.
③ විදුලි පහන් නිවා, නිවසේ ඇති ප්‍රධාන ස්විච්එක ඕෆ් කර දමන්න.
④ කුමන ස්ථානයකට ගියාද? යන බව කඩදාසියක ලියා තබන්න.එම කඩදාසිය ඔබගේ නිවසේ තබායන්න.
⑤ කරුණාකර ආරක්ෂාකාරී මාර්ගයකින් ගමන් කරන්න. ( බේරිලා යන්න )



— සටහන් —

## ( 5 ) ආරක්ෂාව තකා නිවසින් බැහැර වන අවස්ථාවකදී ඔබ විසින් රැගෙනයායුතු දෑ

ඔබ පරිහරණය කරන දෑ ඔබ විසින් කල්පනාකර රැගෙන යන්න.

පහත සදහන් පිංතූර බලා රැගෙන යායුතු දේ පිළිබදව අවබෝධයක් ලබාගන්න.

### උදාහරණ•••



ජංගම දූරකථනය・ෆෝන්
( *Keitaidenwa* )
චාජරය ( *Jūdenki* )



රේඩියෝව
( *Radio* )




බැටරි
( *Denchi* )



අතේ ගෙනියන විදුලිපහන
(ටෝච්එක )
( *Kaichūdentō* )



බෙහෙත්
( *Kusuri* )




මුදල්
( *Okane* )




ජපානයේහැදුනුම්පත
( *Zairyū Kādo* )
පාස්පෝට් එක
( *Passport* )



<u>වටිනා දේවල්( *Kichōhin* )</u>
( බැංකුපොත )
( *Tsūchō* )



ඇදුම්・මේස්
( *Yōfuku・Shitagi* )



තුවාය
( *Taoru* )




වතුර
( *Mizu* )




<u>ක්ෂණිකආහාර</u>
( <u>*Hijōshoku*</u> )

◎ 14 වෙනි පිටුවේ අමාරු වචන ◎

※වටිනා දේවල් ( *Kichōhin* ) : ඔබගේ වටිනා, අත්‍යවශ්‍යදේවල්

※ක්ෂණික ආහාර ( *Hijōshoku* ) : ස්වභාවික විපත් ඇතිවූවිට කෑමට ගන්නාදේවල්.මෙම කෑම රත්නොකර කෑමටගත හැකිය

| වැඩි විස්තර දැනගැනීම සදහා ( විමසීම ) | ලිපිනය | දූරකථන අංකය |
| --- | --- | --- |
| ගිණිගැනීම් හා ආපදා වැළක්වීමේ අංශය ( *Shōbō Bōsaika* ) | 296 බන්චි, තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ㉙ | 0475-80-1116 |

< විමසීම් කළ හැකි වේලාවන් > සදුදා සිට සිකුරාදා දක්වා උදේ8.30සිට හවස 5.15ක්වා

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 5 සන්මු නගරයේ පදිංචිවන විට ලිපිනය වෙනස් වන විට කළයුතු දේ

සන්මු නගරයේ පදිංචි වන අවස්ථාවේදී සහ පදිංචි ස්ථාන වෙනස් කිරීමේදී කරුණාකර නගර සභා කාර්යාලයට පැමිණෙන්න.
නගරසභාවේ ＜ මහජන සම්භන්ධතා අංශය ( *Shiminka* ) ＞ සහ නගර සභාවේ සහ නගරසභා ශාඛා කාර්යාල ( *Shuchchōjyo* ) වලදී ලිපිනය වෙනස්වීම් ආදි කාර්යයන් සිදුකරගත හැක.



## （1） පදිංචිය ඉල්ලුම්කිරීම ( *Tennyū todoke* ) ( සන්මු නගරයේ පදිංචි වීම )

| | | |
|---|---|---|
| ඉල්ලුම් පත් භාරදෙන විට | ජපානයෙන් පිට ( පිටරටක ) සිට සන්මු නගරයේ පදිංචියට පැමිණි විට | වෙනත් නගර වල සිට සන්මු නගරයේ පදිංචියට පැමිණි විට |
| ඉල්ලුම් පත් භාරදීම සිදුකරන කාල සීමාව | පදිංචි වීමට පෙර දැනුම් දීමේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළයුතුවේ. ( සන්මු නගරයේ පදිංචි වූ දිනයේ සිට ) දවස් 14 ක් ගතවීමට පෙර පදිංචිය පිළිබඳව ඉල්ලුම්පත් නගරසභාවට භාරදියයුතු වේ. | |
| රැගෙන ආයුතු ලියකියවිලි ( සියල්ලම ) | ① ගුවන් ගමන් බලපත්‍රය ( පවුලේ සියලු දෙනාගේ ගමන් බලපත්‍රය )<br>※ජපානයට ඇතුළුවූ විටආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන නිලමුද්‍රාව පැහැදිළිව පෙන්විය යුතුයි. නිලමුද්‍රාව නැති අවස්ථාවකදී ජපානයට පැමිණි දිනය සඳහන් කිරීමට හැකි ලිපි රැගෙනආ යුතුය. ( ගුවන් ටිකට්පතේ වායරුපයක් )<br>② ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත ( *Zairyū Kādo* ) හෝ ස්ථිර පදිංචිය සනාථ කරන හැඳුනුම්පත් ( *Tokubetsu Eijūshashō* ) ( පවුලේ සියලු දෙනාගේම )<br>පවුලේ සාමාජිකයින් සිටින විට විවාහ සහතිකය ( *Kon'in Shōmeisho* ) සහ උප්පැන්න සහතිකවල ( *Shusshō Shōmeisho* ) වල පිටපත | ① මේ දක්වා පදිංචි වී සිටි නගරයෙන් පදිංචිය ඉවත් කිරීමේ පත්‍රිකාව ( *Tenshutsu Shōmeisho* )<br>② ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත ( *Zairyū Kādo* ) ස්ථිර පදිංචිය සනාථ කරන හැඳුනුම්පත් ( *Tokubetsu Eijūshashō* ) පවුලේ සියළුදෙනාගේම<br>③ පෞද්ගලික අංකය සහිත කාඩ්පත ( *Kojin Bangō Kādo* ) ＜ *Mainanbā Kādo* ＞<br>④ පවුලේ සාමාජිකයින් සිටින විට විවාහ සහතිකය ( *Kon'in Shōmeisho* ) සහ උප්පැන්න සහතිකවල ( *Shusshō Shōmeisho* ) වල මුල් පිටපත්. |
| රැගෙන ආයුතු ලියකියවිලි ( සියල්ලම ) | ※සහතික වල පිටපත් වායාරුප මගින් ඉල්ලුම් කිරීමට නොහැකිබවකරුණාවෙන් සලකන්න.<br>※ජපන් භාෂාවට පරිවර්තනය කරන ලද ලියකියවිලි ද කරුණාකර රැගෙන එන්න | ※සහතික වල පිටපත් වායාරුප මගින් ඉල්ලුම් කිරීමට නොහැකිබව කරුණාවෙන් සලකන්න.<br>※ජපන් භාෂාවට පරිවර්තනය කරන ලද ලියකියවිලි ද කරුණාකර රැගෙන එන්න. |
| ඉල්ලුම් කළහැකි පුද්ගලයින් | ඔබ හෝ ඔබ සමග පදිංචි වී සිටින පවුලේ අයෙකු ( ඊට අමතරව වෙනත් පුද්ගලයෙකු නගරසභාවට පැමිණෙන්නේ නම් පැවරුම් ලිපිය ( *Ininjō* ) රැගෙන එන්න. ) | |

## (2) <u>පදිංචිය ඉවත් කිරීම ( *Tenshutsutodoke* )</u> ( සන්මු නගරයෙන් පිටවීම )

| | |
|---|---|
| <u>ඉල්ලුම් පත් භාරදෙන</u> විට | සන්මු නගරයේ ජීවත් වූවන් වෙනත් පිට නගරයක පදිංචියට යනවිට |
| ඉල්ලුම් පත් භාරදීම සිදුකරන කාල සිමාව | පදිංචිය අත්හැරයෑමට පෙර නගරයෙන් පදිංචිය වෙනස් වනබව දැනුම් දිය යුතුයි.<br>තවද, පදිංචිය වෙනස් කර දවස් 14 ක් ගතවීමට පෙර ඒ පිළිබඳව දැනුම් දීමේ ඉල්ලුම්පත නගර සභාවට භාර දිය යුතුයි. |
| රැගෙන ආයුතු ලියකියවිලි | ① ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත <u>( *Zairyū Kādo* )</u> හෝ ස්ථිර පදිංචිය සනාථ කරන හැඳුනුම්පත් ( *Tokubetsu Eijūshasho* ) ( පවුලේ සියළුදෙනාගේම )<br>② සීල්එක ( *Inkan* ) ලියාපදිංචි කළ සහතිකය ( සහතික පත්‍රය ලබා ඇති පුද්ගලයෝ )<br>③ <u>ජාතික සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ( *Kokumin Kenkōhokenshō* )</u><br>(සන්මු නගරසභාවේ සෞඛ්‍ය රක්ෂණට ඇතුලත් වී ඇති අය ) |
| ඉල්ලුම් කළහැකි පුද්ගලයින් | ඔබ හෝ ඔබ සමග පදිංචි වී සිටින පවුලේ අයෙකු<br>( ඊට අමතරව වෙනත් පුද්ගලයෙකු නගරසභාවට පැමිණෙන්නේ නම් <u>පැවරුම් ලිපිය ( *Ininjō* )</u> රැගෙන එන්න. ) |



## (3) <u>පදිංචි ස්ථානය මාරුකිරීම ( *Tenkyotodoke* )</u> ( <u>සන්මු නගරයතුළ පදිංචිය වෙනස් කිරීම)</u>

| | |
|---|---|
| <u>ඉල්ලුම් පත් භාරදෙන</u> විට | සන්මු නගරය ඇතුළත පදිංචිය වෙනස් කිරීම |
| නගරසභාවට ඉල්ලුම්පත් භාර දීමේ කාලසීමාව | පදිංචිය වෙනස් කර දවස් 14 ක් ගතවීමට පෙර ඒ පිලිබඳව නගරසභාවටදැනුම් දී ලියාපදිංචි කළයුතුයි |
| රැගෙන ආයුතු ලියකියවිලි | ① ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත <u>( *Zairyū Kādo* )</u> හෝ ස්ථිර පදිංචිය සනාථ කරන හැඳුනුම්පත් ( *Tokubetsu Eijūshasho* ) පත ( පවුලේ සියළුදෙනාගේම )<br>② <u>ජාතික සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ( *Kokumin Kenkōhokenshō* )</u><br>( නගරසභාවේ සෞඛ්‍ය රක්ෂණට ඇතුලත් වී ඇති අය ) |
| ඉල්ලුම් කළහැකි පුද්ගලයින් | ඔබ හෝ ඔබ සමග පදිංචි වී සිටින පවුලේ අයෙකු<br>( ඊට අමතරව වෙනත් පුද්ගලයෙකු නගරසභාවට පැමිණෙන්නේ නම් <u>පැවරුම් ලිපිය ( *Ininjō* )</u> රැගෙන එන්න. ) |



◎ 14 වෙනි පිටුවේ සිට 15 වෙනි පිටුව දක්වා අමාරු වචන ◎

※පදිංචිය ඉල්ලුම් කිරිම ( *Tennyūtodoke* ) : සන්මු නගරයේ පදිංචිය ඉල්ලා සිටීමේදි සන්මු නගරසභාවට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළයුතුවේ.

※ඉල්ලුම් පත් භාර දිම ( *Todokede* ) : අවශ්‍ය ලියකියවිලි ( *Shorui* )<ඉල්ලුම් පත්‍රය ( *Kami* )>නගර සභාවට ඉදිරිපත් කිරිම නගර සභාවට පැමිණ ඉල්ලුම් පත්‍රය පුරවන්න.

※විවාහ සහතිකය ( *Kōn'in Shōmeisho* ) : දෙදෙනා විවාහ වී ඇති බව සඳහන් කර ඇති ලියකියවිලි

※උප්පැන්න සහතිකය ( *Shusshō Shōmeisho* ) : දරුවෙක් ඉපදුන විට, රෝහලෙන් ලැබුණු ලියවිල්ල

※පදිංචිය ඉවත් කිරීමේ පත්‍රිකාව ( *Tenshutsu Shōmeisho* ) : මේ දක්වා පදිංචිවසිටි නගරයේ නගරසභාවෙන් ඔබ ඒනගරයෙන් ඉවත්වෙන බවටලබාදෙන ලියවිල්ල

※පෞද්ගලික අංකය සහිත කාඩ්පත ( *Kojin Bangō Kādo* ) < *Mainanbā Kādo* > : තමා ට පමණක් අයත් අංක12කින් යුත් ඉලක්කම් ලියා ඇති ලියවිල්ල

※පැවරුම් ලිපිය ( *Ininjō* ) : ඔබ හෝ ඔබ සමග පදිංචි වී සිටින පවුලේ අයෙකු ඊට අමතරව වෙනත් පුද්ගලයෙකු නගරසභාවට පැමිණෙන්නේ නම් පැවරුම් ලිපිය ( *Ininjō* ) රැගෙන එන්න.

※පදිංචි ස්ථානය මාරුකිරිම ( *Tenkyotodoke* ) : සන්මු නගර ඇතුළත පදිංචිය මාරුකිරීමේදී ඒ පිළිබඳව නගරසභාවට දැනුම් දීම

※පදිංචිය ඉවත් කිරිම ( *Tenshutsutodoke* ) : සන්මු නගරයෙන් ඉවත් වී වෙනත් නගරයක පදිංචියට යනවිට නගර සභාවට ඒ බව දැනුම් දීම.

※ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත ( *Zairyū Kādo* ) : ජපානයට පැමිණිය විට ජපන් ආගමන විගමන කාර්යාංශයේදී ලබාගත හැකි අයිඩි පත මෙම නමින් හැඳින්වේ. ජපානයේ මාස 6කට වඩා කාලයක් පදිංචි වී සිටින විට මෙම හැඳුනුම්පත ලබාගතහැක.බොහෝ වැදගත් දෙයකි. දිනපතාම මෙය ළගතබා ගතයුතු වේ.

( ආගමන විගමන කාර්යාංශය ගුවන් තොටුපළ ඇතුළේ පිහිටුවා ඇත. )

※ජාතික සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ( *Kokumin Kenkōhokenshō* ) : 24 වෙනි පිටුවේ සිට 27 පිටුව දක්වා කරුණාකර කියවා බලන්න.

| ලියකියවිලි ඉදිරිපත් කරන ස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| මහජන සම්බන්ධතා අංශය ( *Shiminka* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක② | 0475-80-1141 |
| සන්බු උප නගරසභාව ( *Sanbu Shutchōjo* ) | 1884-1 හනියා, සන්මු නගරය ( 1884-1,Haniya,Sammu-shi ) | 0475-89-3600 |
| හසුණුම උප නගරසභාව ( *Hasunuma Shutchōjo* ) | 233 බන්චි,හසුණුමා හා, සන්මු නගරය ( 233,Hasunuma ha,Sammu-shi ) | 0475-86-3111 |
| මත්සුඔ උප නගරසභාව ( *Matsuo Shutchōjo* ) | 3012 බන්චි,ගොතන්දා,මත්සුඔ මචි,සන්මුනගරය ( 3012,Matsuomachi gotanda,Sammu-shi ) | 0479-80-7117 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා උදේ 8.30සිට හවස 5.00 දක්වා

※ඉල්ලුම් කිරීමේදී මෙහි සිදුකෙරෙන කාර්යයන් සඳහා කාලය ගතවේ. එමනිසා කරුණාකර වේලාසනින් නගරසභාවට පැමිණෙන්න.

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 6 සීල්එක ලියාපදිංචි කිරීම / සීල්එක ලියාපදිංචිකළ සහතිකය ( *Inkantōroku / Inkantōroku Shōmeisho* ) < සීල් එක ( *Hanko* එක ) ලියාපදිංචි කිරීම >



ජපානයේ නම ලිවීම වෙනුවට සීල් < *Hanko* > එක භාවිතා කිරීම සිදු කෙරේ.
( අත්සන භාවිතා කිරීම වෙනුවට < සීල් එක > තමගේ නම යොදා සාදා ගතයුතුවේ. )
වැදගත් ලිය කියවිලි සඳහා සීල් එක < *Hanko* > භාවිතා කිරීමේදී එය ලියාපදිංචිකර තිබීම අවශ්‍ය වේ.
වාහන, ඉඩම්, ගොඩනැගිලි ආදිය මිළදී ගැනීමේදී සහ විකිණීමේදී මෙය භාවිතා කරනු ලැබේ.
සමාගමක් සැදීමේදී ද සීල්එක අවශ්‍ය වනු ලැබේ.
සීල් එක ලියාපදිංචි කිරීමේදී නගරසභාවේ <මහජන සම්භන්ධතා අංශය ( *Shiminka* ) >ටපැමිණ ඉල්ලුම් කරන්න.

## (1) සීල් එක < *Hanko* > ලියාපදිංචි කරන ස්ථානය

වයස අවුරුදු 15 න් ඉහල සන්මු නගරයේ පදිංචි පුද්ගලයින් වේ නම් සන්මු නගරසභාවේ < මහජන සම්භන්ධතා අංශය ( *Shiminka* ) > හෝ නගරසභාවේ අනුශාඛා වලදී සීල්එක ලියාපදිංචි කළහැක.
ලියාපදිංචි කළවිට සීල් එක ලියාපදිංචි කළ කාඩ් පත ( *Tōroku Kādo* ) නිකුත් කරනු ලැබේ.





## (2) සීල්එක ලියාපදිංචි කිරීම

| කවුද? | රැගෙන යායුතු දේ | නගරසභාවට පැමිණි දිනයේදී ලියාපදිංචි කළනොහැකි විට |
|---|---|---|
| ඔබ නගරසභාවට පැමිණ සීල්එක ලියාපදිංචි කිරීම | ① ලියාපදිංචි කරන සීල් එක < *Hanko* ><br>② ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැදුනුම්පත ( *Zairyū Kādo* )<br>↓<br>එම දිනයේදීම ලියාපදිංචි කළ හැක. | ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැදුනුම්පත ( *Zairyū Kādo* ) නොමැති පුද්ගලයින්ට, පසුව ලිපික් මගින් දැනුම දෙනු ලබනවා.<br>ඔබ විසින් ලිපියට අදාල පිළිතුරු ලියා, දින 14ට පෙර නගරසභාවට රැගෙන එන්න.<br>↓<br>දින කීපයක් ගතවන විට සීල්එක ලියාපදිංචි කළහැක. |

| කවුද? | රැගෙන යායුතු දේ | නගරසභාවට පැමිණි දිනයේදී ලියාපදිංචි කළනොහැකි විට |
|---|---|---|
| ඔබ වෙනුවට වෙනත් පුද්ගලයෙකු නගරසභාවට පැමිණ <u>ලියාපදිංචි කිරීම</u> | ① ලියාපදිංචි කරන සීල්එක < *Hanko*><br>② පැවරුම් ලිපිය ( *Ininjō* )<br>③ ඔබ වෙනුවට පැමිණි පුද්ගලයාගේ < සීල් එක ><br>④ ඔබ වෙනුවට පැමිණෙන පුද්ගලයාගේ <u>රියදුරුබ බලපත්‍රය ( *Jidōsha Unten Menkyoshō* )</u> හෝ එම පුද්ගලයා බව තහවුරු කෙරෙන ඡායාරූපය ඇතුලත් වෙනත් ලියවිල්ලක් | ඔබ වෙනුවට වෙනත් පුද්ගලයෙකු පැමිණි අවස්ථාවේදී ඔබට තැපැලෙන් ලිපියක් යවනු ලැබේ.<br>ඔබ විසින් එම ලිපියට පිළිතුරු ලියා ඔබ හෝ ඔබ වෙනුවට පැමිණෙන පුද්ගලයා දින 14 ක් ඇතුළත කරුණාකර නගරසභාවට එම ලිපිය රැගෙන පැමිණිය යුතුයි.<br>↓ |
| | දින කිහිපයක් ගත වූවාටපසුව සීල් එක ( ***Inkan*** ) ලියාපදිංචි කළ හැකිය | |

## (3) ලියාපදිංචි කළනොහැකි සීල් වර්ග < *Hanko* > පහත සදහන් දෑ වේ

① පවුලේ අනෙක් අය ලියාපදිංචි කර ඇති සීල්.
② ලියාපදිංචි සහතිකයේ සදහන් නමට වෙනස් නමකින් සෑදූ සීල් < *Hanko* >
③ නමට අමතරව වෙනස් දෙයක් සදහන් කරඇති සීල් < *Hanko* >
④ මිලිමීටර් 8කට වඩා ප්‍රමාණයෙන් කුඩා සීල් < *Hanko* >
⑤ මිලිමීටර්25කට වඩා විශාල සීල් < *Hanko* >
⑥ රබර් වලින් සාදන ලද සීල් < *Hanko* >
⑦ නම පැහැදිළි ලෙස නොපෙනෙන සීල් < *Hanko* >




ලියාපදිංචි කළනොහැකි සීල් < *Hanko* >

## (4) සීල්එක ලියාපදිංචි කර ඇති සහතිකය ( *Inkantōroku Shōmeisho* ) ලබාගැනීම

ඔබගේ සීල්එක < *Hanko* > ලියාපදිංචිකිරීමෙන් අනතුරුව සීල්එක ලියාපදිංචි කළ සහතිකය ( *Inkantōroku Shōmeisho* ) ඉල්ලුම්කළහැක.
නගරාසභාවේ < මහජන සම්භන්ධතා අංශය ( *Shiminka* ) > හෝ උපනගර සභා කාර්යාල වලට ගොස් ඉල්ලුම් කළහැකිය.

<නගරසභාවට යනවිට රැගෙන යායුතු දේ>

① සීල්එක ලියාපදිංචි කළ සහතිකය ( *Inkan Tōrokushō* ) < *Tōroku Kādo* >
② මුදල්යෙන් 300 ක්



— සටහන් —



◎ 17 පිටුවේ සහ 18 වෙනිපිටුවේඅමාරු වචන ◎

※ලියාපදිංචි ( කිරීම ) ( *Tōroku* ) : ( මෙම පිටුවේ සදහන් ආකාරයට ) ඔබගේ සීල් එක < *Hanko* > නගරසභාවේ ලියාපදිංචිකිරීම

※සීල්එක ලියාපදිංචි කළ කාඩ්පත ( *Tōroku Kādo* ) : ඔබගේ සීල් එක < *Hanko* > ලියාපදිංචිකල විට ලැබෙන කාඩ්පත. බොහෝ වටිනා දෙයක් වන බැවින් කරුණාකර එය ආරක්ෂා කාරීව නැතිනොවන ලෙස වගබලා ගන්න.

※රියදුරු බලපත්‍රය ( *Jidōsha Unten Menkyoshō* ) : රිය පැදවීමට සුදුසු යැයි සදහන් කරඇති,ඔබගේ මුහුණේ චායාරූපයක් සදහන් වන බලපත්‍රය.

| ලියකියවිලි ඉදිරිපත් කරන ස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| මහජන සම්භන්ධතා අංශය ( *Shiminka* ) | 296 බන්චි,තොනොදයි,සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක② | 0475-80-1141 |
| සන්බු උප නගරසභාව ( *Sanbu Shutchōjo* ) | 1884-1 හනියා, සන්මු නගරය ( 1884-1,Haniya,Sammu-shi ) | 0475-89-3600 |
| හසුණුමා උප නගරසභාව ( *Hasunuma Shutchōjo* ) | 233 බන්චි,හසුණුමාහා,සන්මු නගරය ( 233,Hasunuma ha,Sammu-shi ) | 0475-86-3111 |
| මත්සුඔ උප නගරසභාව ( *Matsuo Shutchōjo* ) | 3012 බන්චි,ගොතන්දා,මත්සුඔ මචි,සන්මුනගරය (3012,Matsuomachi gotanda,Sammu-shi ) | 0479-80-7117 |

< විමසීම් කළ හැකි වේලාවන් > සදුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.00 දක්වා

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

※ඉල්ලුම් කිරීමේදී මෙහි සිදුකෙරෙන කාර්යයන් සදහා කාලය ගතවේ. වේලාසනින් නගරසභාවට පැමිණ ඉල්ලුම් කරන්න.

# 7 තාවකාලික අංක තහඩුව ( කරිනම්බා ) ( *Kari Nanbā* )

「 පරික්ෂණ පවත්වා නැති වාහන 」 සහ 「 ලියාපදිංචි කරනැති වාහන 」 මහාමාර්ගයේ පදිනවිට කරුණාකර තාවකාලික වාහන අංකයක තහඩුව ඉල්ලුම් කළයුතුයි.එවිට නගර සභාව විසින් ඒසඳහා වූ බලපත්‍රය සහ තාවකාලික අංක තහඩුවක් ලබාදෙනු ලැබේ.

## ( 1 ) තාවකාලික අංකය ( *Kari Nanbā* ) ඉල්ලුම් කරන ස්ථානය

නගරසභාවේ <මහජන සම්බන්ධතා අංශය ( *Shiminka* )> වෙත ගොස් ලබා ගතහැක.පහත සඳහන් දෑ රැගෙන එන්න

< නගරසභාවට යනවිට රැගෙන යායුතු දේ >

පහත සඳහන් ① සිට ⑤ දක්වා සහතික පත් සියල්ලම රැගෙන එන්න.

① වාහනයේ රක්ෂණ පත ( *Jibaiseki Hokenshō* ) ( පිටපතක් පාවිච්චි කල නොහැක. කාලසීමාව අවසන් වී ඇති ( *Yūkōkikan* ) රක්ෂණ සහතික පරිහරණය කල නොහැක. )

② පහත සඳහන් ලිපිද්‍රව්‍ය වලින් කුමක් හෝ රැගෙන එන්න.


- වාහනයයේ පරික්ෂණ වාර්තාව ( *Jidōsha Kensashō* )
- වාහනයේ ලියාපදිංචිය මකාදැමූ බව සඳහන් සහතිකය ( *Masshō Tōroku Shōmeisho* )
- තෝරොකු ෂිකිබෙත්සු ජෝහෝතෝ ත්සුචි ෂො ( *Tōroku Shikibetsu Jyōhōtō Tsūchisho* )
- ජිදෝෂා කෙන්සෂෝ හෙන්නෝ ෂෝමෙයිෂො ( *Jidōsha Kensashō Hennō Shōmeisho* )
- අපනයන සහතිකය ( *Yushutsu Yotei Todokede Shōmeisho* )

③ සීල් එක < *Hanko* > ( සමාගමේ නමින් ඉල්ලුම් කිරීමේදී සමාගමේ සීල් එක අවශ්‍ය වේ. )

④ සීල් එක ලියාපදිංචි කිරීමට පැමිණීමේදී පහත සඳහන් දේවලින් කුමක්හෝ රැගෙන එන්න.

- රියදුරු බලපත්‍රය ( *Jidōsha Unten Menkyoshō* )
- ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත ( *Zairyū Kādo* )
- ස්ථිර පදිංචිකරුවන්ගේ සහතිකය ( *Tokubetsu Eijūshashō* )


⑤ මුදල් යෙන් 750 ක්



## （2）තාවකාලික අංක තහඩුව ( *Kari Nanbā* ) පාවිච්චිකළ හැකි කාලසීමාව

තාවකාලික අංක තහඩුව ( *Kari Nanbā* ) ලබාගත් දිනයේ සිට දින 5 ක් ඇතුළත පරිහරණය කළහැකිය. තාවකාලික අංක තහඩුව පරිහරණය කර අවසන් වුන දිනයේ සිටදින 5 ක් ඇතුළත අනිවාර්යයෙන්ම නගරසභාවට ආපසු භාර දිය යුතුවේ. එවිට බලපත්‍රය සහ අංක තහඩුව රැගෙන එන්න.

※තාවකාලික අංක තහාඩුව ලබාගත නොහැකි අවස්ථා ද ඇත.වැඩි විස්තර සඳහා නගරසභාවේ < මහජන සම්භන්ධතා අංශය ( *Shiminka* ) > වෙත පැමිණෙන්න.




◎ 20 වුවේ අමාරු වචන ◎

※වාහනයේ රක්‍ෂණ පත ( *Jibaiseki Hokenshō* ) : වාහනය මිළදී ගත් පුද්ගලයා අනිවාර්යයෙන්ම ඇතුල්විය යුතු රක්‍ෂණ පත

※වාහනයයේ පරීක්ෂණ වාර්තාව ( *Jidōsha Kensashō* ) : වාහනය පරීක්ෂණයට භාජනය කරඇති බව සඳහන් කර ඇති ලියවිල්ල. මෙම සහතික පත නොමැතිව වාහනය පාරේ පැදවිය නොහැක.

※වාහනයේ ලියාපදිංචිය මකාදැමූ බව සඳහන් සහතිකය ( *Masshō Tōroku Shōmeisho* ) : වාහනය කඩා නොදමා විකුණන විට අවශ්‍ය වන ලියවිලි

※තෝරොකු ෂිකිබෙත්සු ජෝහෝතෝ ත්සුචි ෂො ( *Tōroku Shikibetsu Jōhōtō Tsūchisho* ) : එම වාහනය කඩා නොදමා විකුණන විට වාහනය හිමි කරුට ලැබෙන ලියවිලි

※ජිදෝෂා කෙන්සෂෝ හෙන්නෝ ෂෝමෙයි ෂො ( *Jidōsha Kensashō Hennō Shōmeisho* ) : එම වාහනය අයින් කලවිට ලැබෙන ලියවිල්ල

※අපනයන සහතිකය ( *Yushutsu Yotei Todokede Shōmeisho* ) : මෙම වාහනය වෙනත් රටකට විකිණීමේ දී භාවිතා කරන ලියවිල්ල

| ඉල්ලුම් කරන ස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| මහජන සම්භන්ධතා අංශය ( *Shiminka* ) | 296 බන්චි,තොනොදයි,සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ① | 0475-80-1141 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා දිනයන්හිපෙරවරු8.30සිට පස්වරු5.00දක්වා

※ඉල්ලුම් කිරීමේදී මෙහි සිදුකෙරෙන කාර්යයන් සඳහා කාලය ගතවේ. වේලාසනින් නගරසභාවට පැමිණ ඉල්ලුම් කරන්න.

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 8 පෞද්ගලික අංකය සහිත කාඩ්පත < *Mainanbā Kādo* >



නගරසභා කාර්යාලයට පැමිණ සන්මු නගරයේ පදිංචිය ඉල්ලුම් කර ඇති පුද්ගලයින්ට  පෞද්ගලික අංකය සහිත කාඩ්පත < *Mainanbā Kādo* > සාදාගත හැක. <u>( *Kojin Bangō Kādo* )</u>

<පෞද්ගලික අංකය සහිත කාඩ්පත < *Mainanbā Kādo* >
අංක 12 හකින් යුත් ඉලක්කම් ලියා ඇති ප්ලාස්ටික්  අවරණයකින් යුත් කාඩ් පතකි.මෙම කාඩ්පතේ ඔබගේ චායාරූපය සහිතව, නම ,ලිපිනය, <u>උපන්දිනය</u>, <u>ස්ත්‍රී පුරුෂ භාවය</u>  සදහන් කොට ඇත.
ඔබගේ <u>හැඳුනුම්පත</u> ( *Mibunshōmeisho* )වශයෙන්ද භාවිතා කිරීමේ හැකියාව ඇත.







## (1) කුමන අවස්ථා වලදී බ භාවිතා කළහැකිද ?

① බැංකුවේදී ඔඅබගේ ගිණුම් පොතක් විවුර්ත කිරිමේදී

② කොන්බිනි යකදී ඔබගේ  <u>පදිංචි සහතිකය( *Jyūmintōroku hyō* )</u>  <u>සීල්එක ලියාපදිංචි කර ඇති සහතිකය ( *Inkantōroku Shōmeisho* )</u> ලබා ගන්නා  අවස්ථාවලදී

③ <u>සෞඛ්‍ය රක්‍ෂණ කාඩ්පත ( *Kenkōhokenshō* )</u>ලෙස භාවිතා කරන විට විදේශ රටකට මුදල් යැවීමේ දී

④ අන්තර්ජාලය හරහා <u>ආධායම් බදු සදහා බදු වාර්ථා</u> ගොණුකිරීම






## (2) කුමන ආකාරයකට ඉල්ලුම් කරණවාද ?

① සන්මු නගරයේ පදිංචිය ඉල්ලුම් කල පුද්ගලයින්ට  මෙය ඉල්ලුම් කිරීමේ හැකියාව ඇත.

② කරුණාකර නගරසභා කාර්යාලයට පැමිණෙන්න

③ අයදුම් පත්‍රය සම්පූර්ණ කරන්න

● නගරසභා කාර්යාලයේදී ඔබගේ චායාරූපය ගැනීමට හැකියාව ඇත.

● ජපානයේ රැඳිසිටීමේ අවසර කාලය මාස 3 කට වඩාඅඩු පුද්ගලයින් පදිංචි කාලය දීර්ඝ කිරීමෙන් පසුව මෙම කාඩ් පත සදහා ඉල්ලුම් කරන්න.

## (3) ඉල්ලුම් කිරීමෙන් පසුව කුමක් කළයුතුය?

① ඉල්ලුම් කිරීමෙන් පසුව දින 3 0 ක කාලයකදී  පෝස්කාඩ්පතක් නිවසට පැමිණේ

② නගරසභා කාර්යායට දුකථනයෙන් අමතන්න.කාඩ්පත ලබාගැනීමට පැමිණෙන දිනය දැනුම්දෙන්න.

③ පහත සදහන් දෑ නගරසභා කාර්යාලයට රැගෙන යන්න.
〔පෝස්කාඩ් පත, පෞද්ගලික අංකය දැනුම් දීමේ කාඩ්පත < *Mainanbā no Tsūchi Kādo* >
ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත ( *Zairyū Kādo* )〕

## （4） ප්‍රවේසම් වියයුතු කරුණු

පෞද්ගලික අංකය සහිත කාඩ්පත < *Mainanbā Kādo* > භාවිතා කළහැකි කාලසීමාව වන්නේ ඔබගේ ජපානයේ පදිංචිය සදහා අවසර දී ඇති කාලයහා සමානවේ.

එම කාලසීමාව අවසන් වුවහොත් පෞද්ගලික අංකය සහිත කාඩ්පත < *Mainanbā Kādo* > භාවිතාකළනොහැකිය.

<u>ආගමන විගමන කළමනාකරණ ආයතනයෙන්</u> ඔබගේ ජපානයේ පදිංචි කාලසීමාව දීර්සකළහොත් නගරසභා කාර්යායටගොස් පෞද්ගලික අංකය සහිත කාඩ්පත < *Mainanbā Kādo* > ඉල්ලුම් කරන්න.

ඔබට මෙම කාඩ් පත ඉල්ලුම් කිරීමට හැකිකාලසීමාව ඉක්ම ගියහොත් මුදල් වැයවේ.

ඒ පිළිබදව ප්‍රවේසම් වන්න.



◎ 22 පිටුවේ සහ 23වෙනිපිටුවේඅමාරු වචන ◎

※උපන්දිනය : ඔබගේ උපන් දිනය

※ස්ත්‍රී පුරුෂ භාවය : ගැහැණු පිරිමි බව

※හැදුනුම්පත (*Mibunshōmeisho*) : ඔබ ජපන් ජාතිකයෙක්ද? යනවග තහවුරු කිරීමට හැකි දෑ 〔<u>රියදුරු බලපත්‍රය</u> ( <u>*Jidōsha*</u> *Unten Menkyoshō* )යනාදිය 〕

※පදිංචි සහතිකය(*Jyūmin hyō*) :ඔබගේ සහ පවුලේ සාමාජිකයින්ගේ ලිපිනයසදහන් කර ඇති ලියවිල්ල ( මෙය ලබාගැනීමේදී මුදල් වැයවේ)

※සීල්එක ලියාපදිංචි කර ඇති සහතිකය ( *Inkantōroku Shōmeisho* ) : නගර සභා කාර්යාලයේ ඔබගේ සීල් එක ලියා පදිංචි කලවිට ලබාගත හැකි සහතික පත්‍රය( මෙය ලබාගැනීමේදී මුදල් වැයවේ )

※සෞඛ්‍ය රක්‍ෂණ කාඩ්පත ( *Kenkōhokenshō* ):රෝහලේදී ඔබ ගෙවන මුදල් ප්‍රමාණය අඩු කිරීම සදහා භාවිතා කරනුලබන කාඩ්පත.

※ආධායම් බදු වල බදු වාර්ථාව : රැකියාව කර වැටුප් ලබාගත් විට බදුකාර්යාලයට බදු ගෙවිය යුතුවේ.

※ආගමන සේවා නියෝජිත කාර්යාංශය : තොක්යෝ ආගමන කාර්යාංශය,චිබා ශාඛා කාර්යාලය

〒260-0026 චිබා නගරය,චුඔකු,චිබා මිනතෝ 2-1 චිබා මධ්‍යයම ප්‍රජා මධ්‍යස්ථානය ඇතුළත
( Chiba Chuo Community Center , 2-1 Chiba-minato, Chuo-ku, Chiba City,Chiba Prefecture. )

දුරකථන අංකය : 043-242-6597

| වැඩි විස්තර දැනගැනීම සදහා(විමසීම්) | ලිපිනය | දුරකථන අංක |
|---|---|---|
| මහජන සම්භන්ධතා අංශය ( *Shiminka* )<br>( පෞද්ගලික අංකය සහිත කාඩ්පත<br>< *Mainanbā Kādo* > ) | 296 බන්චි,තොනොදයි,සන්මුනගරය<br>( 296,Tonodai,Sammu-shi )කවුළු අංක ⑤ | 0475-77-8110 |

< විමසීම් කළ හැකි වේලාවන් > සදුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.00 දක්වා

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 9 ජාතික සෞඛ්‍ය රක්ෂණය( *Kokumin Kenkōhoken* )

සන්මු නගරයේ පදිංචි සිටින සියලුම පුද්ගලයින් කරුණාකර සෞඛ්‍ය රක්ෂණයට ඇතුල් වන්න. සෞඛ්‍ය රක්ෂණයන්, ඔබ රාජකාරියේ යෙදීසිටින සමාගම විසින් ඇතුළත් කරනු ලබන සෞඛ්‍ය රක්ෂණය , සමාජ සෞඛ්‍ය රක්ෂණය 「 *Shakaihoken* 」 ලෙසත් නගරසභාව විසින් හඳුන්වාදෙනු ලබන සෞඛ්‍ය රක්ෂණය, ජාතික සෞඛ්‍ය රක්ෂණය 「 *Kokumin Kenkōhoken* 」 යනුවෙන්නුත් හඳුන්වනු ලබන සෞඛ්‍ය රක්ෂණ වර්ග දෙකක් ඇත.

ජාතික සෞඛ්‍ය රක්ෂණය 「 *Kokumin Kenkōhoken* 」 නගරසභාව විසින් ඇතුලත් කරගනු ලබන සෞඛ්‍ය රක්ෂණයට ඇතුළත් වීමේදී නගරසභාවේ ＜ ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* ) ＞ වෙත ගොස් කරුණාකර උපදෙස් ලබාගන්න.

## (1) ජාතික සෞඛ්‍ය රක්ෂණය යනු ( *Kokumin Kenkōhoken* ) ?

අසනීප වූ විට රෝහලේදී ඔබ ගෙවන මුදල් ප්‍රමාණය අඩු කිරීම සඳහා භාවිතා කරනු ලබන උපකල්පන ක්‍රමයක් ලෙස නම් කළහැක.මේ සඳහා බද්දක් ගෙවීම අත්‍යවශ්‍ය වේ.

සෞඛ්‍ය රක්ෂණයට ඇතුල් වූ විට <u>ජාතික සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ( *Kokumin Kenkōhokenshō* ) ＜ *Hoken Kādo* ＞</u> නිකුත් කරනු ලැබේ.

රෝහලකට යෑමේදී කරුණාකර මෙම ජාතික සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත රැගෙන යායුතුයි.




රෝහලේදී මුදල් ගෙවිය යුතු ආකාරය පහත සඳහන් ලෙස පෙන්වාදිය හැක.

■ රෝහලේදී ඔබ මුදල් ගෙවන ප්‍රමාණය

| වයස 0 සිට අවුරුදු 6 දක්වා | → | වයස අවුරුදු 7 සිට අවුරුදු 69 දක්වා | → | වයස අවුරුදු 70 සිට අවුරුදු 74 |
|---|---|---|---|---|
| 20% | | 30% | | 20% (වැටුපවැඩිපුද්ගලයින් 30 %) |

［ විමසීම ］ ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* )
☎0475-80-1143

◎ 24 පිටුවේ අමාරු වචන◎

※ජාතික සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ( *Kokumin Kenkōhokenshō* ) ＜ *Hoken Kādo* ＞ : ජාතික සෞඛ්‍ය රක්ෂණයට ඇතුල් වීමේදී ලැබෙන කාඩ්පත

## (2) පහත සදහන් පුද්ගලයින් ජාතික සෞඛ්‍ය රක්ෂණය සදහා ඇතුලත් විය නොහැකිය

- සමාගමේ <u>සමාජ සෞඛ්‍ය රක්ෂණය ( *Shakaihoken* )</u> ට ඇතුලත් වී සිටින පුද්ගලයින්
- <u>සමාජ සෞඛ්‍ය රක්ෂණය ( *Shakaihoken* )</u> ට ඇතුළත් වී, යැපෙන්නන් සදහා මුදල් වියදම් කරන පුද්ගලයෝ
- අවුරුදු 75 ටවඩා වයසින් වැඩි පුද්ගලයින්
- <u>ජීවන සහනාධාර ( *Seikatsu Hogo* )</u> ලබාගන්නා පුද්ගලයින් ( තමන් විසින් ජීවන වියදම් සපයා ගැනීමට නොහැකි පුද්ගලයින් සදහා ජපන් රජය විසින් ජීවන වියදම වෙනුවෙන් සහනාධාර මුදලක් සපයනු ලැබේ. )
- ජපානයේ පදිංචි කාලය මාස 3කට වඩා අඩු කාලයක් පවතින පුද්ගලයින්

[ විමසීම ] ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* )
☎0475-80-1143

## (3) ජාතික සෞඛ්‍ය රක්ෂණ බද්ද ( *Kokumin Kenkōhokenzei* )

ජාතික සෞඛ්‍ය රක්ෂණට ඇතුල් වූ විට ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු < *Kokumin Kenkōhokenzei* > අයකරගනු ලැබේ. ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු, තීරණය කරඇති දිනයට පෙර ගෙවිය යුතුය. අදාල පුද්ගලයාගේ පෙර අවුරුද්දේ ලබාගත් වාර්ෂික වැටුපට අනුව වර්ෂයකට ගෙවිය යුතු බදු මුදල තීරණය කරනු ලැබේ.

[ විමසීම ] බදුගෙවීමේ අංශය ( *Kazeika* )
☎0475-80-1281

## (4) ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු ( *Kokumin Kenkōhokenzei* ) ගෙවීම පිළිබදව

ජූලි මාසයේදී ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු ( *Kokumin Kenkōhokenzei* ) ගෙවීමේ ලිපි නිවසට ලැබුණු විටකරුණාකර බදු මුදල් ගෙවිය යුතුයි. ඔබගේ <u>බැංකු ගිණුමෙන් ස්වයංක්‍රීයව මුදල් ගෙවීම ( *Kōza Furikae* )</u> ට කැමති පුද්ගලයින් නගරසභාවේ < බදු එක්රැස් කිරීමේ අංශය ( *Shūzeika* ) > වෙත ගොස් කරුණාකර උපදෙස් ලබාගන්න. වැඩිවිස්තර දැනගැනීම සදහා නගර සභාවේ < බදු එක්රැස් කිරීමේ අංශය ( *Shūzeika* ) > වෙත පැමිණෙන්න.ජාතික සෞඛ්‍ය රක්ෂණය සදහා වන බදු මුදල්, අදාල දිනට ගෙවීමට අපහසු අය නගරසභාවේ < බදු එක්රැස් කිරීමේ අංශය ( *Shūzeika* ) > වෙත ගොස් කරුණාකර උපදෙස් ලබාගන්න.

පහත සදහන් ස්ථාන වලදී සහ ආකාරයන්ට අනුව ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු ( *Kokumin Kenkōhokenzei* ) ගෙවිය හැකිය .

- නගරසභා කාර්යාලය
- කොන්බිනි
- බැංකුව
- තැපැල් කාර්යාලය
- මුදල් වෙනුවට භාවිතා කරන විද්‍යුත් ගෙවීම් ක්‍රම 〔 පේපේ (PayPay),ලයින් පේ (LINE Pay) , ඩි පේ(D-Pay) , ජේ කොයින් (J-coin) , එයියු පේ (auPay) 〕

[ විමසීම ] බදු එක්රැස් කිරීමේ අංශය ( *Shūzeika* )
☎0475-80-1151

## (5) නියමිත දිනයට පෙර ගෙවීම් නොකළවිට ඔබ බෙහෙවින්ම අපහසුතාවයට පත්වේ

ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු නොගෙ වූ විට පහත සදහන් ආකාරයට සිදුවේ.

- බදු මුදල් ගෙවීම සදහාඉල්ලා සිටීමේ ලිපිය ( *Tokusokujō* ) යවනු ලබනවා
- එවිට ඔබගේ සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත නගරසභාවේ < ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* ) > ට ආපසු භාර දිය යුතුයි.
- රෝහලට අධික මුදලක් ගෙවීමට සිදුවේ. සියලුම මුදල් ඔබ විසින් ගෙවිය යුතුයි.
- සෞඛ්‍ය රක්ෂණ බදු මුදල් නොගෙවූ විට ඔබගේ විසා බලපත්‍රය දීර්ඝ කිරීම හා 〔 ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැදුනුම්පත ( *Zairyū Kādo* )〕 ලබාගැනීමට නොහැකිවන අවස්ථාද ඇත.

[ විමසීම ] බදු එක් රැස් කිරීමේ අංශය ( *Shūzeika* )
☎0475-80-1151

## (6) ජාතික සෞඛ්‍ය රක්ෂණට ඇතුල් වීමේදී සහ එයින් ඉවත් වීමේදී පහත සදහන් ආකාරයට සිදුවේ

ඊලග වාරයේදී දින 14 ක්ඉකුත් වීමට පෙර නගරසභාවේ <ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* )> වෙත පැමිණෙන්න.

**ජාතික සෞඛ්‍ය රක්ෂණයට ( *Kokumin Kenkōhoken* ) ඇතුල්වීම**

- සන්මු නගරයේ පදිංචියට පැමිණිවිට
- තම සමාගමේ සමාජ සෞඛ්‍ය රක්ෂණ ( *Shakaihoken* ) යෙන් ඉවත් වූ විට
- දරුවෙක් ඉපදුන විට
- නගරසභාව විසින් ලබාදෙන ජීවන සුභසාධන මුදල් ( *Seikatsu Hogo* ) ලබාගැනීම නැවැත්වූ විට

**ජාතික සෞඛ්‍ය රක්ෂණයෙන් ඉවත් විම**

- සන්මු නගරයේ පදිංචියෙන් ඉවත් වන විට
- තම සමාගමේ සමාජ සෞඛ්‍ය රක්ෂණය ( *Shakaihoken* ) ට ඇතුල් වූ විට
- මරණයට පත්වූ විට
- නගරසභාව විසින් ලබාදෙන ජීවන සුභසාධන මුදල් ( *Seikatsu Hogo* ) ලබාගන්නා විට

[ විමසීම ] ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* )
☎0475-80-1143

◎ 25 පිටුවේ සහ 26 පිටුවේ අමාරු වචන ◎

※සමාගම් රක්ෂණය : සමාගමක සේවයේ යෙදී සිටින පුද්ගලයින් සදහා වූ සෞඛ්‍ය රක්ෂණය,සමාජ සෞඛ්‍ය රක්ෂණය ( *Shakaihoken* ) ලෙස හදුන්වනු ලබයි සමාජ සෞඛ්‍ය රක්ෂණය ( *Shakaihoken* ) ජාතික සෞඛ්‍ය රක්ෂණ ( *Kokumin Kenkōhoken* ) හා සමාන සෞඛ්‍ය රක්ෂණවර්ගයක් ලෙස හදුන්වනු ලැබේ.හ ජපානයේ ජීවත් වන සෑම පුද්ගලයෙක්ම ජාතික සෞඛ්‍ය රක්ෂණය ( *Kokumin Kenkōhoken* ) හෝ සමාජ සෞඛ්‍ය රක්ෂණය ( *Shakaihoken* ) යන රක්ෂණ වර්ග දෙකෙන් එකකට ඇතුල් විය යුතුය.

※ජීවන සුභසාධන සහනාධාර ( *Seikatsu Hogo* ) : තමන් විසින් ජීවන වියදම් සපයා ගැනීමට නොහැකි පුද්ගලයින් සදහා ජපන් රජයෙන් ජීවන වියදම සදහා සහනාධාර මුදලක් සපයනු ලැබේ.

※බැංකු ගිණුමෙන් ස්වයංක්‍රියව මුදල් ගෙවීම ( *Kōza Furikae* ) : බැංකුව හරහා ස්වයංක්‍රියව වෙනත් ගිණුම් හිමියෙකුට මුදල් ගෙවීම

※බදු මුදල් ගෙවීම සදහාඉල්ලා සිටීමේ ලිපිය ( *Tokusokujō* ) : බදු මුදල් නියමිත දිනට පෙර නොගෙවූ පුද්ගලයින් සදහා නගරසභාවේ බදුගෙවීමේ අංශයෙන් අදාල පුද්ගලයින් වෙත යවන ලිපිය.

— සටහන් —



| වැඩි විස්තර දැනගැනීම සඳහා(විමසීම්) | ලිපිනය | දුරකථන අංක |
|---|---|---|
| ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* ) | 296 බන්චි,තොනොදයි,සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ⑥ | 0475-80-1143 |
| බදු ගෙවීමේ අංශය ( *Kazeika* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ⑦ | 0475-80-1281 |
| බදු එක්රැස් කිරීමේ අංශය ( *Shūzeika* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ⑧ | 0475-80-1151 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා දිනයන්හිපෙරවරු8.30සිට පස්වරු5.00දක්වා

※ඉල්ලුම් කිරීමේදී මෙහි සිදුකෙරෙන කාර්යයන් සඳහා කාලය ගතවේ. වේලාසනින් නගරසභාවට පැමිණ ඉල්ලුම් කරන්න.

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 10 බදු වර්ග ( *Zeikin no Shurui* )




බදු මුදලින් පොලිස් ස්ථානය, ගිණි නිවීමේ, මහා මාර්ග, ජල පහසුකම් පැන්ෂන් එක සඳහා යොදාගනු ලැබේ.තවද සෞඛ්‍ය සේවය සහ සහන සේවා කටයුතු සඳහාද, අධ්‍යාපනය හොඳ තත්වයක පවත්වාගැනීම යනාදී කටයුතු සඳහා මෙමෙ බදු මුදල් පරිහරණය කරනු ලැබේ.
මේ සඳහා නගරවාසී සියළු දෙනාම එක්වී ගෙවන ලබන මුදල් 「 බදු 」 වශයෙන් හැඳින්වේ.
නගරසභාවට ගෙවනු ලබන බදු මුදල් ( *Zeikin* ) පහත සඳහන් ආකාරයට හඳුන්වා දිය හැකිය.

### නාගරික ජීවනබදු ( *Shikenminzei* )

ජනවාරි මාසයේ පලවෙනිදා පදිංචි වී සිටින ස්ථානයට බදු මුදල් ගෙවනු ලැබේ.මැයි මාසයේ සිට ජූනි මාසය ඇතුළත බදුගෙවන ලියකියවිලි ඔබගේ නිවසට යවනුලැබේ.බැංකු,තැපැල් කාර්යාල,කොන්බිනි සහ නගර සභාවේ දී බදු මුදල් ගෙවිය හැක.

### දේපළබදු ( *Koteishizanzei* )

අවුරුද්දේ ජනවාරි මාසයේ ඉඩම් සහ ඩනැගිලි හිමි පුද්ගලයන් මෙමෙ බදු මුදල්ගෙවිය යුතුයි.මැයි මාසය වනවිට බදු මුදල් ගෙවිය යුතු ලිපි යවනු ලබනවා. බැංකුව හෝ තැපැල්කාර්යාලය,කොන්බිනිසහ නගරසභාවේ දී බදු මුදල් ගෙවීමේ හැකියාව ඇත.

### කේ වාහන සඳහා ගෙවන බදු ( *Keijidōshazei* )

අප්‍රේල් 1වෙනි දිනට, 125ccවර්ගයේ මෝටර් බයිසිකල් ( *Gendōkitsuki Jitensha* ) සහ කේ වාහන ( *Keijidōsha* ) තිබෙන පුද්ගලයින් විසින් බදු ගෙවිය යුතුයි.මැයි මාසය වනවිට බදු ගෙවීම සඳහා ලියුමක් ඔබගේ නිවසට යවනු ලැබේ.බැංකුව,තැපැල්කාර්යාලය,කොන්බිනියට, නගරසභාවේදීද මුදල් ගෙවිය හැකිය.
නගරසභාවේදීද මුදල් ගෙවිය හැකිය.

### ජාතික සෞඛ්‍ය රක්ෂණ බදු ( *Kokumin Kenkōhokenzei* )

24 වෙනි පිටුවේ සිට 27 වෙනි පිටුව දක්වා කරුණාකර කියවන්න.



◎ 28 වෙනි පිටුවේ අමාරු වචන ◎
※125ccවර්ගයේ මෝටර් බයිසිකල් ( *Gendōkitsuki Jitensha* ) : මෙම බයිසිකල් පැදවීමේදී වාහන රියදුරු බලපත්‍රයක් අවශ්‍ය වේ.
※කේ වාහන ( *Keijidōsha* ) : 125ccසිට 250ccදක්වා බයික් 660ccදක්වා කාර්

| වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම ) | ලිපිනය | දුරකථන |
|---|---|---|
| බදු අංශය ( *Kazeika* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක⑦ | 0475-80-1281 |

＜ විමසීම් කළ හැකි වේලාවන් ＞ ඉරිදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු5.00දක්වා
※සෙනසුරාදා,ඉරිදා,රජයේනිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 11 ආධායම්බදු සහතිකය ( *Shotoku・Kazei Shōmeisho* )



「 ආධායම්බදු සහතිකය ( *Shotoku・Kazei Shōmeisho* ) 」 අවශ්‍ය අය කරුණාකර පහත සදහන් ආකාරයට ඉල්ලුම් කරන්න.

## ( 1 ) ආධායම්බදු සහතික ( *Shotoku・Kazei Shōmeisho* ) ඉල්ලුම් කිරීමේ ස්ථානය

නගරසභාවේ < බදු ගෙවීමේ අංශය ( *Kazeika* ) > වෙත ගොස් ඉල්ලුම් කළහැක. ඒ සදහා පහත සදහන්දෑ රැගෙන පැමිණෙන්න.

< නගරසභාවට යනවිට රැගෙන යායුතු දේ >

① ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැදුනුම්පත ( *Zairyū Kādo* ) හෝ රියදුරු බලපත්‍රය ( *Jidōsha Unten Menkyoshō* ) ( ඔබගේ මුහුණේ ඡායරූපය සදහන් කාඩ් පතක් )

② මුදල්යෙන් 300 ක්

③ පැවරුම් ලිපිය ( *Ininjō* ) ( එකට පදිංචවී වී සිටින පවුලේ අය හැර වෙනත් පුද්ගලයන් පැමිණි විට )

## ( 2 ) ආධායම් බදු සහතිකය නිකුත් කළහැකි පුද්ගලයින් පහත සදහන් ආකාරයට වේ ( *Shotoku・Kazei Shōmeisho* )

● **අදාල අවුරුද්දේ ජනවාරි පළවෙනිදා සන්මු නගරයේ ලිපිනය ලියාපදිංචි කර තිබෙන පුද්ගලයින්**

※ජනවාරි පළවෙනිදා සන්මු නගරයේ ලිපිනයේ ලියා පදිංචිනොවූ අය,ඔබ මීට පෙර පදිංචි වී සිටි නගරයේ නගරසභාවට ගොස් අදාල ලියකියවිලි ලබාගන්න.

※ජනවාරි මාසයේ 1වෙනිදාට ජපානයේ පදිංචි ය තහවුරු කිරීමට නොහැකි පුද්ගලන්ට මෙම ලියවිල්ල ලබාගත නොහැක.

※ 「 ලිපිනය ලියාපදිංචි කර ඇති පුද්ගලයා යනු ( *Jyūsho ga aru hito* ) 」 නගරසභාවට පැමිණ තමන් මෙම නගරයේ ලියාපදිංචි වන බවටසදහන් කර, ලියාපදිංචිය ඉලුම් කල පුද්ගලයා වේ.

| වැඩි විස්තර දැනගැනීම සදහා ( විමසීම් ) | ස්ථානය | දුරකථන අංකය |
|---|---|---|
| බදු අංශය ( *Kazeika* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) වෙනි කවුළුව ⑦ | 0475-80-1281 |

< විමසීම් කළ හැකි වේලාවන් > සදුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.00 දක්වා


※සෙනසුරාදා,ඉරිදා,රජයේනිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 12 කරුණාකර බදු ( *Zeikin* ) ගෙවන්න

ඔබට අදාල බදු මුදල් ගෙවීමේ නියමිත දිනය ( *Nōfu Kigen* ) ට පෙර ගෙවා අවසන් කරන්න.
බදු මුදල් නියමිත දිනට වඩා ප්‍රමාද වී ගෙවීමේදී ගෙවියයුතු මුදල් ප්‍රමාණය වැඩිවන බව සලකන්න.
බදු මුදල් ගෙවීමේ නියමිත දිනය ( *Nōfu Kigen* ) මුදල් ගෙවියයුතු ලියවිල්ලේ සදහන් කරඇත.
බදු මුදල් ගෙවීමේ නියමිත දිනය ( *Nōfu Kigen* ) වනවිටගෙවීම් කටයුතු කිරීමටඅපහසු වුවහොත් < බදු එක්රැස් කිරීමේ අංශය ( *Shūzeika* ) > වෙත ගොස් උපදෙස් ලබාගන්න.

## බදු ගෙවීම පිළිබදව දැනුම් දීම සදහා නිවසට යවනු ලබන ලියවිල්ල ( *Nōzei Tsūchisho* )

පහත රූපයේ සදහන් ලියුම් කවරය තැපෑලෙන්ඔබගේ නිවසට යවනු ලැබේ.
ලිපිය ලැබුණුවිට අනිවර්යයෙන්ම ලියුම් කවරයේ ඇතුළේ ඇති ලිපිය බලන්න. නියමිතකර ඇති දිනට පෙර කරුණාකර බදු මුදල් ගෙවා අවසන් කරන්න.




◎ 30 වෙනි පිටුවේ අමාරු වචන ◎

※නියමකළ දිනය : මෙඉන් අදහස් කරන්නේ බදු ගෙවන දිනය යන්නයි.මුදල් ගෙවන කොලයේ 「ගෙවීම සදහා අවසන් දිනය」 යනුවෙන් සදහන් කරඇත.අනිවාර්යයෙන්ම නියමකළ දිනයට කරුණාකර බදුමුදල් ගෙවන්න.


## නගර බදුගෙවීමේ නියමිත

පහත සදහන් බදු වර්ග පිළිබදව එම බදු මුදල් ගෙවියයුතු මාසය සදහන් කර ඇත. කුමන දිනට පෙර මුදල් ගෙවිය යුතුද යන්න ගෙවීම්පත (*Nōfusho*) පරීක්ෂාකර බලන්න.බදු මුදල් නියමකර ඇති දිනට පෙර ගෙවා අවසන් නොකළහොත් ඔබට වැඩිපුර මුදලක් සමග ගෙවීමට සිදුවේ.

| | මැයි | ජූනි | ජූලි | අගෝස්<br>තු | සැප්තැ<br>ම්බර් | ඔක්තෝ<br>ම්බර් | නොවැ<br>ම්බර් | දෙසැ<br>ම්බර් | ජනවා<br>රි | පෙබර<br>වාරි |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| (නාගරික ජීවනබදු )<br>*Shikenminzei* | | ○ | | ○ | | ○ | | | ○ | |
| ( දේපළබදු )<br>*Koteishizanzei* | ○ | | ○ | | ○ | | | ○ | | |
| ( කේ වාහන සදහා<br>ගෙවන බදු )<br>*Keijidōshazei* | ○ | | | | | | | | | |
| ( ජාතික සෞඛ්‍ය<br>රක්‍ෂණ බදු )<br>*Kokumin*<br>*Kenkōhokenzei* | | | ○ | ○ | ○ | ○ | ○ | ○ | ○ | ○ |

## බදුගෙවූබව සදහන්කරන සහතිකය ( *Nōzei Shōmeisho* )

බදුගෙවූබව සදහන්කරන සහතිකය ( *Nōzei Shōmeisho* ) යනු වෙන් හැදින්වෙන්නේ අදාල බදු මුදල් කොතරම් ප්‍රමාණයක් ගෙවා අවසන් කර ඇතිද,යැයි සදහන් කර ඇති ලියවිල්ලක් වේ.



## බදු වාර්ථා ගොණුකිරිම ( *Kakutei shinkoku* )

ඔබ රැකියාවේ වැටුප් ලබා එම මුදල් එකතුකර පුද්ගලයින් සහ සමාගමෙන් වැටුප් ලබන පුද්ගලයින් ආධායම් බදු (*Shotokuzei*)සඳහා අධායම් වාර්ථා සකස් කොට නගරසභාවට ඉදිරිපත් කළයුතු වේ.

ආධායම් බදු(*Shotokuzei*) සඳහා අධායම් වාර්ථා සකස් කොට බදු කාර්යාලයට සහ නගරසභා කාර්යාලයට ඉදිරිපත් කළයුතුවේ.
ආධායම් බදු සඳහා(*Shotokuzei*) අධායම් වාර්ථා ඉදිරිපත් නොකළහොත් ආධායම්බදු සහතිකය ( *Shotoku・Kazei Shōmeisho*) ලබාගැනීමට නොහැකිවේ.

① බදු වර්ථා සකස් කිරීමේ කාලසීමාව ( *Kakuteishinkoku* )
සෑම වර්ෂයකම පෙබරවාරි මාසයේ 16 වෙනිදා සිට මාර්තු මාසයේ 15 වෙනිදා දක්වා කාලය

② බදු වර්ථා සකසන ස්ථානය
බදු ගෙවීමේ කාර්යාලය ට යන්න.
② < ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* ) > වෙත ගොස් දරුවාව ජාතික සෞඛ්‍ය රක්ෂණය 「 ***Kokumin Kenkōhoken*** 」 ට ලියාපදිංචි කරවාගන්න.

( 24වෙනි පිටුව )
( 69 වෙනි පිටුව )

< ළමා සුභසාධන උපකාරක අංශය ( *Kosodate Shienka* ) > තුළදී ළමා වෛද්‍ය සහනාධාර 「 ***Kodomo Iryōhi Josei*** 」 (වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා නගරසභාවෙන් ලබාදෙන සහනදායි සේවාව) ඉල්ලුම් කරන්න.

( 69 වෙනි පිටුව)

- **දරු උප්පත්තියෙන් පසුව <u>සෞඛ්‍ය නිළධාරිණිය ( *Hokenshi* )</u> දරුවා බැලීමට නිවසට පැමිණේ**

  දරුවෙක් ඉපදුන නිවසට <u>වින්නබු මාතාව ( *Josanshi* )</u> හෝ <u>සෞඛ්‍ය නිළධාරිණිය ( *Hokenshi* )</u> දරුවා බැලීමට පැමිණෙනු ලැබේ.දරුවාගේ උස සහ බර මැනබලයි.
  අම්මා සහ දරුවා නිරෝගීව සිටිනවාදැයි පරීක්ෂා කර බලයි.
  මුදල් වැයනොවේ.

◎ 64 පිටුවේ අමාරු වචන ◎
※වින්නබු මාතාව ( *Josanshi* ) : ඉපදෙන බිළිදා පිළිබදව සියළු විස්තර උපදෙස් ලබාගැනීමට හැකි නිළධාරිනිය
※සෞඛ්‍ය නිළධාරිණිය ( *Hokenshi* ) : ශරීර සෞඛ්‍ය පිළිබදව උපදෙස් ලබාගත හැකි නිළධාරිනිය

— සටහන් —



| වැඩි විස්තර දැනගැනීම සදහා ( විමසීම් ) | ලිපිනය | දුරකථනඅංකය |
|---|---|---|
| සෞඛ්‍ය සේවා උපකාරක අංශය හපිනෙසු<br>( *Kenkō Shienka Hapinesu* )<br>**ගර්භ නීමව්වරුන් සහ ළදරුවන් සදාහා** උපකාරක මද්‍යස්ථානය<br>( *Kosodate Sedai Hōkatsu Shien Sentā* ) | 296 බන්චි, තොනොදයි, සන්මුනගරය<br>( 296,Tonodai,Sammu-shi ) | 0475-80-1381 |

<සඳුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.00 දක්වා
※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.



# ළදරු සෞඛ්‍ය පරීක්ෂණයට ( සායනයට ) පැමිණෙන්න

කරුණාකර ඔබගේ දරුවා සෞඛ්‍ය පරීක්ෂණය ( අළුත උපන් බිළිඳාගේ සෞඛ්‍ය සායනය ( Nyūyōji Kenkō Shinsa ) ට රැගෙන එන්න. මේ සඳහා මුදල් වැයනොවේ. දරුවාගේ සෞඛ්‍ය තත්වය පිළිබඳව කරුණාකර උපදෙස් ලබාගන්න

● පහත සඳහන් පිළිවෙලට කරුණාකර තෙවතාවක් සායන වලට සහභාගී වන්න.

| කවදා? | කොහේදිද | කුමක් කළයුතුද ? සිදුකරන සේවාවන් |
|---|---|---|
| <u>ළදරු වෛද්‍ය පරීක්ෂණය</u><br>( *Nyūji Kenkō Shinsa* )<br><br>දරුවාඉපදී මාස 3 සිටමාස 4 ක් පසුවූ විට<br>පවත්වනු ලබන සායනය | සන්මු ඉරියෝ සෙන්තා<br><u>( *Sammu Iryō Sentā* )</u> | • <u>වෛද්‍යවරයා ( *Ishi* )</u> දරුවාගේ ශරීර සෞඛ්‍ය තත්වය පිළිබඳව පරීක්ෂාකර බලයි.<br>• දරුවාගේ ශරීරයේ බර සහ උස ප්‍රමාණය පරීක්ෂාකර දෙනු ලැබේ.<br>• ඔබට නොදන්නා දෙයක් ඇත්නම් සෞඛ්‍ය නිලධාරීන්ගෙන් කරුණාකර උපදෙස් ලබාගන්න.<br>• <u>පෝෂණ නිලධාරීන් ( *Eiyōshi* )</u> ගෙන් දරුවාගේ <u>ආහාර ( *Shokuji* )</u> පිළිබඳව කරුණාකර උපදෙස් ලබාගන්න.<br>• <u>දන්ත සහායක නිළධාරීන් ( *Shikaeiseishi* )</u> ගෙන් දරුවාගේ දත් පිළිබදව උපදෙස් ලබාගන්න.<br>• මේ පිළිබද සදහන් කර ඇති පිංතූර පොත් ලබාගත හැකිය. |
| අවුරුදු එකහමාරේ ළදරු සායනය<br>( *Issairokkagetsuji Kenkō Shinsa* )<br><br>දරුවා ඉපදී වයස අවුරුදු එකහමාරේ සිට අවුරුදු 2 ක දක්වා කාලය තුළදී පවත්වනු ලබන සායනය<br><br>අවුරුදු දෙකහමාරේ ළදරු වන් සඳහා වූ දන්ත සායනය<br>( *Nisairokkagetsuji Shika Kenkō Shinsa* )<br><br>දරුවා ඉපදී වයස අවුරුදු දෙක හමාරේ සිට අවුරුදු තුන ලබන කාලය තුළ දී පවත්වනු ලබන සායනය. | සෞඛ්‍ය සේවා මද්‍යස්ථානය<br>( *Hoken Sentā* ) | • <u>වෛද්‍යවරයා ( *Ishi* )</u> දරුවාගේ ශරීර සෞඛ්‍ය තත්වය පිළිබඳව පරීක්ෂාකර බලයි.( අවුරුදු එකහමාරේ දරුවන්ගේ ශරීර සෞඛ්‍ය සායන සඳහාපමණි )<br>• <u>දන්ත වෛද්‍ය වරයා ( *Shikaishi* )</u> දරුවාගේ දත්වල සෞඛ්‍ය තත්වය පිළිබදව පරීක්ෂාකර කරදෙනු ලැබේ.<br>• ශරීරයේ බර සහ උස ප්‍රමාණය පරීක්ෂාකර දෙනු ලැබේ.<br>• ඔබට නොදන්නා දෙයක් ඇත්නම් සෞඛ්‍ය නිලධාරීන්ගෙන් කරුණාකර උපදෙස් ලබාගන්න.<br>• <u>පෝෂණ නිලධාරීන් ( *Eiyōshi* )</u> ගෙන් දරුවාගේ <u>ආහාර ( *Shokuji* )</u> පිළිබදව කරුණාකර උපදෙස් ලබාගන්න.<br>• <u>දන්ත සහායක නිළධාරීන් ( *Shikaeiseishi* )</u> ගෙන් කරුණාකර දරුවාගේ දත් පිළිබදව උපදෙස් ලබාගන්න. |
| අවුරුදු 3 නේ ළදරු සායනය<br>( Sansaiji Kenkō Shinsa )<br><br>දරුවාට අවුරුදු 3 යි,මාස6සිට අවුරුදු 4 දක්වා | සෞඛ්‍ය සේවා මද්‍යස්ථානය<br>( *Hoken Sentā* ) | • <u>වෛද්‍ය වරයා ( *Ishi* )</u> දරුවාගේ ශරීර සෞඛ්‍ය තත්වය පිළිබදව පරීක්ෂාකර බලනුලැබේ.<br>• <u>දන්ත වෛද්‍ය වරයා ( *Shikaishi* )</u> දරුවාගේ දත්වල සෞඛ්‍ය තත්වය පිලිබදව පරීක්ෂාකර දෙනු ලැබේ.<br>• ශරීරයේ බර සහ උස ප්‍රමාණය පරීක්ෂාකර දෙනු ලැබේ.<br>• මුත්‍රා පරීක්ෂාකර දෙනු ලැබේ.<br>• ඇස් පෙනීම පිළිබදව පරීක්ෂාකර දෙනු ලැබේ.<br>• කණ ඇසීම පිළිබදව පරීක්ෂාකර දෙනු ලැබේ.<br>• මහජන සෞඛ්‍ය නිලධාරීන් සමග ඔබට නොදන්නා දෑ පිළිබදව උපදෙස් ලබාගතහැක.<br>• <u>පෝෂණ නිලධාරීන් ( *Eiyōshi* )</u> ගෙන් දරුවාගේ <u>ආහාර ( *Shokuji* )</u> පිළිබදව කරුණාකර උපදෙස් ලබාගන්න.<br>• <u>දන්ත සහායක නිළධාරීන් ( *Shikaeiseishi* )</u> ගෙන් කරුණාකර දරුවාගේ දත් පිළිබදව උපදෙස් ලබාගන්න. |

# දරුවන්ගේ එන්නත් < *Chūsha* > ලබාගන්න

දරුවා අසනීප නොවන ආකාරයට කරුණාකර එන්නත් < *Chūsha* > ලබාගන්න.
මුදල් වැයනොවේ.
විවිධ ආකාරයේ එන්නත් < *Chūsha* > වර්ගඇත.
දරුවන් සිටින අය රෝහලට යෑමට පෙර නගරසභාවේ <සෞඛ්‍ය සේවා උපකාරක අංශය ( *Kenkō Shienka* ) > වෙත ගොස් උපදෙස් ලබාගන්න.



< නගරසභාවට යනවිට රැගෙන යායුතු දේ >

① මාතෘ සහ ළමා සෞඛ්‍ය අත්පොත ( *Boshi Kenkō Techō* ) ගර්භනී මවගේ සහ දරුවාගේ සෞඛ්‍ය තත්වයන් සටහන් කරන අත්පොත

② මේදක්ව ලබාගෙන ඇති එන්නත් පිළිබඳව සඳහන් කරඇති ලියවිල්ලක්

නගරසභාවේ < සෞඛ්‍ය සේවා උපකාරක අංශය ( *Kenkō Shienka* ) > වෙත ගොස් උපදෙස් ලබාගැනීමෙන්
නොමිළේ එන්නත්විදීම සඳහා අවශ්‍ය වන ඉල්ලුම් පත් ලබාගත හැක. දරුවා ඉපදුන අවස්ථාවේදීද මෙම ඉල්ලුම්පත් ලබගතහැකිය. මෙම එන්නත් විදීමේ ඉල්ලුම් පත රෝහලේදී භවිතා කරනු ලැබේ. ( මෙම කොලයට එන්නත් විදීමේ ඉල්ලුම් පත ( *Yoshinhyō* ) යැයි කියනුලබනවා. )

◎ 65 පිටුවේ සහ 66 වෙනිපිටුවේඅමාරු වචන ◎

※ළදරු වෛද්‍ය පරීක්‍ෂණය ( *Nyūyōji Kenkō Shinsa* ) : අළුත උපන් බිළිදාගේ ශරිර සෞඛ්‍ය පරීක්‍ෂණය අළුත උපන් බිළිදාගේ සෞඛ්‍ය තත්වය පිළිබඳව පරික්ෂා කිරිම රෝහලේ දී සහ නගරසභාවේ සෞඛ්‍ය උපකාරක සේවා මද්‍යස්ථානයයේ දී සිදු කරනු ලබනවා.මෙය වයස් මට්ටම් තුනකදී සිදු කෙරේ.දරුවා ඉපදී මාස තුනේදී සිදුකරන සායනය ( *Nyūji Kenkō Shinsa* ) අවුරුදු එකහමරේදී පවත්වන සායනය ( *Issairokka getsuji Kenkō Shinsa* ) සහ අවුරුදු තුනේදී පවත්වන සායනය ( *Sansaiji Kenkō Shinsa* ) වේ.

※වෛද්‍ය වරයා ( *Ishi* ) : රෝහලේ වැඩකරන වෛද්‍ය වරුන්. ලෙඩ සහ තුවාල හොදකරදෙන වෛද්‍ය වරයා

※පෝෂණ නිලධාරීන් ( *Eiyōshi* ) : ආහාර පිළිබදව සාකච්ඡා කළහැකි නිලධාරීන්

※දන්ත සහායක නිළධාරීන් ( *Shikaeiseishi* ) : දත් පිරිසිදුව තබාගැනීම පිළිබදව උපදෙස් ලබාගතහැකි නිලධාරීන්

※දන්ත වෛද්‍ය වරයා ( *Shikaishi* ) : නරක් වූ දත් නැවත සනීපකරදෙන වෛද්‍ය වරයා

※ආහාර ( *Shokuji* ) : කෑමට ගන්නා දේවල්

## ළමා එන්නත් වර්ග සහ එන්නත් ලබාගන්නා අවස්ථා

| බෙහෙත් විදින වයස් ප්‍රමාණය | එන්නත් වර්ගය ( හිරගනා වලින් ) | එන්නත් සංඛ්‍යාව |
|---|---|---|
| ඉපදී මාස 2කෙන් | රොතා ( *Rota* )<br>හිබ ( HIB )<br>හයිඑන්ක්වුකින් ( *Haienkyūkin* )<br>බි ගතා කන්එන් ( B *gatakan'en* ) | 1 වන වතාව<br>1 වන වතාව<br>1 වන වතාව<br>1 වන වතාව |
| ඉපදී මාස 3න් | රොතා ( *Rotha* )<br>හිබ ( *HIB* )<br>හයිඑන්ක්වුකින් ( *Haienkyūkin* )<br>බි ගතා කන්එන් ( *B gatakan'en* )<br>යොන්ෂුකොන්ගෝ ( *Yonshukongō* ) | 2 වන වතාව<br>2 වන වතාව<br>2 වන වතාව<br>2 වන වතාව<br>1 වන වතාව |
| ඉපදීමාස 4න් | රොතා ( රොතා තෙක්කු *Rotatekku* )<br>හිබ ( *HIB* )<br>හයිඑන්ක්වුකින් ( *Haienkyūkin* )<br>යොන්ෂුකොන්ගෝ ( *Yonshukongō* ) | 3 වන වතාව<br>3 වන වතාව<br>3 වන වතාව<br>2 වන වතාව |
| ඉපදී මාස 5න් | බිසී ( *BCG* )<br>යොන්ෂුකොන්ගෝ ( *Yonshukongō* ) | 3 වන වතාව |
| ඉපදී මාස 6සිට මාස11දක්වා | නිහොන්නෝඑන් (*Nihonnōen* )<br>බි ගතා කන්එන් ( *B gatakan'en* ) | 1 වන වතාව<br>2 වන වතාව<br>3 වන වතාව |
| වයස අවුරුද්දක් ගතවූ විට | එමආර්ඉක්කි ( MR *Ikki* )<br>සුයිතෝ ( *Suitō* )<br>හිබ ( *HIB* )<br>හයිඑන්ක්වුකින් ( *Haienkyūkin* ) | එම්.ආර්වල 1 වන වස්ථාව<br>1 වන වතාව<br>4 වන වතාව<br>4 වන වතාව |
| වයස අවුරුද්දයි මාස හයක් වූ විට1 | යොන්ෂුකොන්ගෝ ( *Yonshukongō* )<br>සුයිතෝ ( *Suitō* )<br>නිහොන්නෝඑන් ( *Nihonnōen* ) | 4 වන වතාව<br>2 වන වතාව<br>3 වන වතාව |
| ප්‍රාථමිකපාසල්ශිෂ්‍යයෙක්වීමට පෙර අවුරුද්ද | එමආර්නිකි ( *MR Niki* ) | එම්.ආර්වල 2 වන වතාව |
| අවුරුදු හතයිමාස හයක් වීමට පෙර | නිහොන්නෝඑන් ( *Nihonnōen* ), යොන්ෂුකොන්ගෝ ( *Yonshukongō* ) නම් එන්නත ලබාගෙන නොමැති දරුවන් සඳහා | |
| අවුරුදු නමයේ සිට අවුරුදු දොළහක් අතර | නිහොන්නෝඑන්නිකි ( *Nihonnōen niki* ) | නිහොන්නෝඑන් 4 වන වතාව |
| අවුරුදු එකොළහේ සිට අවුරුදු දොළහ අතර කාලය | නිෂූකොන්ගෝ ( *Nishukongō* ) | |
| අවුරුදු එකොළහේ සිට අවුරුදු පහළොව අතර කාලය | ගර්භාෂ පිළිකා එන්නත ( *Shikyūkeigan* ) | 3 වන වතාව |

* කරුණාකර රෝහලට දුරකතන ඇමතුමක් දී එන්නත් ලබාගැනීම සඳහා දිනයක් වෙන්කරවා ගන්න.
රෝහලට රැගෙන යායුතු දේ : මාතෘ සහ ළමා සෞඛ්‍ය අත්පොත ( *Boshi Kenkō Techō*)ගර්භනී මවගේ සහ දරුවාගේ සෞඛ්‍ය තත්වයන් සටහන් කරන අත්පොත,එන්නත් විදීමේ ඉල්ලුම්පත ( *Yoshinhyō* ) ( මුදල් වැය නොවී එන්නත් ලබාගන්නා ඉල්ලුම් පත් ) එන්නත් විදීම ප්‍රමාදවී ඇත්නම් හෝ නොදන්නා අවස්ථා වලදී නගරසභාවේ.< සෞඛ්‍ය ස්වා උපකාරකඅංශය ( *Kenkō Shienka* ) > වෙතොස් කරුණාකර උපදෙස් ලබාගන්න.

— සටහන් —



| වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම් ) | ලිපිනය | දුරකථනඅංකය |
|---|---|---|
| සෞඛ්‍ය සේවා උපකාරක අංශය<br>( *Kenkō Shienka* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය<br>( 296,Tonodai,Sammu-shi ) | 0475-80-1172 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.00 දක්වා

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ



# 17 දරුවන් සදාවඩා ගැනීම ❶

දරුවන් සදාවඩා ගැනීමේදී ඔවුන්ගේ වර්ධනය සඳහා ජපන් රජය විසින් මාෂිකව පිරිනමනු ලබන සහනාධාර මුදලක් ඇත. ඒ වගේම දරුවන්ට රෝහලෙන් ප්‍රතිකාර ලබාගැනීමේ දී, ඒ සඳහා මුදල් වැය නොවන සේවාවන් ඇත.

වැඩි විස්තර දැනගැනීම සඳහා නගර සභාවේ < ළමා ආරක්ෂණ ආධාරක අංශය ( *Kosodate Shienka* ) > වෙත පැමිණෙන්න.

## (1) ළමා දීමනාව(දරුවන් හදාවඩා ගැනීම සඳහා ලැබෙන සහනාධාර මුදල්) ( *Jidō Teate* ) (සහනාධාර මුදලක් පිරිනැමෙනු ලැබේ )

දරුවාට අවුරුදු 15 දක්වා <කණිෂ්ඨ ද්විතික පාසැල අවසන් වන තෙක් > ලැබෙන සහනාධාර මුදල් වේ. නගරසභාවේ < ළමා ආරක්ෂණ ආධාරක අංශය ( *Kosodate Shienka* ) > වෙත ගොස් මෙම සේවාව සඳහා ඉල්ලුම් කළහැක.





< නගරසභා කාර්යාලයට යනවිට රැගෙන යායුතු දේ >

① බැංකු පොත ( *Tsūchō* )

② <u>පෞද්ගලික අංකය සහිත කාඩ්පත ( *Kojin Bangō Kādo* ) < *Mainanbā Kādo* ></u>

## (2) රෝහලට යන අවස්ථාවේදී වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම ( *Kodomo Iryōhi* ) ( රෝහල් ගාස්තුවකින් තොරව ප්‍රතිකාර ලබාගැනීම )

දරුවන්ට අවුරුදු 15 දක්වා < ද්විතික පාසැල අවසන් වන තෙක් > රෝහලට මුදල් ගෙවීම අවශ්‍ය නොවේ. ප්‍රථමයෙන්ම දරුවාව <u>සෞඛ්‍ය රක්ෂණය ( *Kenkōhoken* )</u> ට ඇතුල් කරන්න.

නගරසභාවේ < ළමා ආරක්ෂණ ආධාරක අංශය ( *Kosodate Shienka* ) > වෙත ගොස් මෙම සේවාව ඉල්ලුම් කළහැක.

රෝහලේ දී ගෙවන ලද මුදල් නැවත ලබාගැනීමට හැකිය

<නගරසභා කාර්යාලයට යනවිට රැගෙන යායුතු දේ>

① සිල් එක < *Hanko* >

② දරුවාගේ <u>සෞඛ්‍ය රක්ෂණ පත ( *Kenkōhokensho* ) < *Hoken Kādo* ></u>

③ දෙමාපියන්ගේ සහ දරුවාගේ <u>පෞද්ගලිකඅංකය සහිත කාඩ්පත ( *Kojin Bangō Kādo* ) < *Mainanbā Kādo* ></u>

④ දරුවා පාසලට යනබව තහවුරු කළහැකි ලියවිල්ලක්, <u>පාසැලේ ශිෂ්‍ය හැඳුනුම්පත < *Gakkō no Mibun Shōmeisho* ></u>

⑤ බැංකු පොත ( *Tsūchō* )



## (3) රෝහලෙන් ප්‍රතිකාර ලබාගැනීමේදී උසස් පාසලේ දරුවන් සඳහා වූ සේවාව (*Kōkōseitō Iryōhi*) (උසස් පාසැල් සිසුන් සඳහා වෛද්‍ය සහනාධාරය )

දරුවා කණිෂ්ඨ ද්විතික පාසැලෙන් සමුගත් විට අවුරුදු 18 දක්වා < පාසල් කාලය අවසන වන තෙක් > රෝහලෙන් බෙහෙත් ලබාගැනීමේදී වෛද්‍ය ප්‍රතිකාර සඳහා වැයවූ මුදල් නැවත ලබාගතහැකි ක්‍රමයක් ඇත. නගරසභාවේ < ළමා ආරක්ෂණ ආධාරක අංශය ( *Kosodate Shienka* ) > වෙත ගොස් මෙම සේවාව ඉල්ලුම් කළහැක.
රෝහලෙන් ප්‍රතිකාර ගත විට වැයවූ මුදල් නැවත ලබාගත හැක.

< නගරසභාවට යනවිට රැගෙන යායුතු දේ >




① සිල් එක < *Hanko* >
② දරුවාගේ <u>සෞඛ්‍ය රක්ෂණ පත ( *Kenkōhokensho* ) < *Hoken Kādo* ></u>
③ දෙමාපියන්ගේ සහ දරුවාගේ <u>පෞද්ගලිකඅංකය සහිත කාඩ්පත ( *Kojin Bangō Kādo* ) < *Mainanbā Kādo* ></u>
④ දරුවා පාසලට යනබව තහවුරු කළහැකි ලියවිල්ලක්, <u>ශිෂ්‍ය හැඳුනුම්පත < *Gakusei Shōmeisho* ></u>
⑤ රිසිට් පත
⑥ බැංකු පොත ( *Tsūchō* )

◎ 69 පිටුවේ සහ 70 පිටුවේ අමාරු වචන ◎

※සෞඛ්‍ය රක්ෂණ පත ( *Kenkōhokenshō* ) < *Hoken Kādo* > : 23 පිටුවේ සිට 26 පිටුව දක්වා කියවා බලන්න。

※පෞද්ගලික අංකය සහිත කාඩ්පත ( *Kojin Bangō Kādo* ) < *Mainanbā Kādo* > : අංක12කින් යුත් තමන් සඳහා පමණක් වූ කාඩ්පත

※සෞඛ්‍ය රක්ෂණය ( *Kenkōhoken* ) : 23 පිටුවේ සිට 26 පිටුව දක්වා කියවා බලන්න。

※ශිෂ්‍ය හැඳුනුම්පත ( *Gakusei Shōmeisho* ) : පාසලේ ශිෂ්‍යයෙක් බව සඳහන් කර ඇති කාඩ් පතකි. ශිෂ්‍යයින්ට පාසලෙන් ලබා ගත හැක. < *Gakuseishō* > යැයි සඳහන් කරන ශිෂ්‍ය හැඳුනුම්පත වේ.

| වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම් ) | ලිපිනය | දුරකථනඅංකය |
|---|---|---|
| ළමා ආරක්ෂණ ආධාරක අංශය ( *Kosodate Shienka* ) | 296 බන්චි,තොනොදයි,සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) | 0475-80-2631 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.00 දක්වා
※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 18 දරුවන් සදාවඩා ගැනීම ②



ප්‍රාථමික පාසැලට ඇතුල් විම් දක්වා කාලය තුළ දරුවන් රැක බලාගන්නා ස්ථානයක් ඇත.
ඔබ රැකියාවේ යෙදෙනවානම්, දරුවාගේ වයස් ප්‍රමාණය අනුව දරුවා රැක බලාගන්නා දිවාසුරැකුම් මද්‍යස්ථානය දැනගත හැකිය.
වැඩි විස්තර සඳහා නගරසභාවේ < ළමා ආරක්ෂණ ආධාරක අංශය ( *Kosodate Shienka* ) > වෙත පැමිණෙන්න.

<ජපානයේ අධ්‍යාපන ක්‍රමය>

| වයස | අවුරුදු6දක්වා | 7 8 9 10 11 12 | 13 14 15 | 16 17 18 | 19 20 21 22 |
|---|---|---|---|---|---|
| පාසැල | ළමා දිවාසුරැකුම් මද්‍යස්ථානය (*Kodomoen*) ළදරු පාසැල (*Yōchien*) දිවාසුරැකුම් මද්‍යස්ථානය (*Hoikuen*) | ප්‍රාථමික පාසැල (*Shōgakkō*) ( වර්ෂ අවුරුදු 6 ) | කණිෂ්ඨ උසස් පාසැල (*Chūgakkō*) ( අවුරුදු 3 ) | (උසස් පාසැල මහාවිද්‍යාලය) ( *Kōtō Gakkō*) | විශ්වවිද්‍යාලය (*Daigaku*) |
| | | ප්‍රාථමික පසැල් දරුවන්ගේ දිවාසුරැකුම් සංගම් ( *Gakudō Kurabu*) | | | |




## (1) ළදරු පාසැල ( *Yōchien*) ·
## ළදරු පාසලේ දිවාසුරැකුම් මද්‍යස්ථානය ( *Kodomoen Tanjibu*)

වයස අවුරුදු 3 න ලැබූ දරුවන් ප්‍රාථමික පාසලට ඇතුලත් කිරීම දක්වා කාලය තුළ ,රැකබලා ගැනීම සඳහා ළදරු පාසලට හෝ දිවා සුරැකුම් මද්‍යස්ථානයට ඇතුළත් කිරීමට හැකිය.
අවුරුදු 3 න ලැබූ කුමන දරුවෙකුට වුනත් මෙම මද්‍යස්ථාන වලට ඇතුළත් වියහැකිය.
දෙසැම්බර් 10 වෙනිදා වූවිට ඉල්ලුම්පත් භාර දෙනු ලැබුවහොත්, ඊලග වසරේ අප්‍රේල් මාසයේ සිට මෙම මද්‍යස්ථාන වලට ඇතුලත්විය හැකිය.
වැඩි විස්තර දැනගැනීම සඳහා නගරසභාවේ <ළමා ආරක්ෂණ ආධාරක අංශය ( *Kosodate Shienka*) > වෙත පැමිණෙන්න.

## (2) දිවාසුරැකුම් මද්‍යස්ථානය (Hoikuen)・ ළමා දිවාසුරැකුම් මද්‍යස්ථානය (Kodomoen Chōjibu)




ඔබ රැකියාවේ යෙදී සිටිනම් හෝ ඔබ සහ අසනීප වූ විට දරුවන්ව දිවාසුරැකුම් මද්‍යස්ථානයකට ඇතුළත් කළහැක.ළමුන් ඇතුලත් කරගන්නා ප්‍රමාණය තීරණයකර ඇත. දෙසැම්බර් 10වෙනිදා වෙනවිට ඉල්ලුම්පත් භාරදුන්විට ඊලග වසරේ අප්‍රේල් මාසයේ සිට දරුවාව මෙයට ඇතුළත් කළ හැක.වැඩි විස්තර සදහා නගරසභාවේ < ළමා ආරක්ෂණ ආධාරක අංශය ( *Kosodate Shienka* ) > වෙත ගොස් අසා දැනගත හැක. කුඩා බිළිදන්ද ඇතුලත් කළ හැකි අතර, වැඩි විස්තර සදහා නගරසභාවේ < ළමා ආරක්ෂණ ආධාරක අංශය ( *Kosodate Shienka* ) > වෙත පැමිණෙන්න.



## (3) ප්‍රාථමික පසැල් දරුවන්ගේ දිවාසුරැකුම් සංගම් ( *Gakudō Kurabu* ) ( දරුවා ප්‍රාථමික පාසැලට ඇතුල් වූ පසු දිවාසුරැකුම් සංගම් ( *Gakudō Kurabu* ) වලට ද ඇතුළත්කළ හැක )

දරුවා ප්‍රාථමික පාසලට ඇතුළත් වූ පසු, ඔබ රැකියාවේ යෙදෙන විට දරුවාව මෙම ස්ථානයට රැකබලාගැනීමට භාරදිය හැකිය. වැඩි විස්තර සදහා නගරභවේ < ළමා අධ්‍යාපන අංශය ( *Kodomo Kyōikuka* ) >වෙත ගොස් අසා දැනගත හැක.






| ළදරු පාසැල්, ( *Yōchien* ) ,ළමා දිවා සුරැකුම් මද්‍යස්ථානය, ( *Hoikuen,Kodomoen* ) පිළිබදව උපදෙස් ලබාගතහැකි ස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| ළමා ආරක්ෂණ ආධාරක අංශය ( *Kosodate Shienka* ) | 296බන්චි,තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi )කවුළු අංක ⑩ | 0475-80-2632 |

< විමසීම් කළ හැකි වේලාවන් > සදුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.00 දක්වා

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

| ප්‍රාථමික පසැල් දරුවන්ගේ දිවාසුරැකුම් සංගම් ( *Gakudō Kurabu* ) පිළිබදව උපදෙස් ලබාගතහැකි ස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| ළමා අධ්‍යාපන අංශය ( *Kodomo Kyōikuka* ) | 279-1බන්චි,තොනොදයි,සන්මුනගරය ( 279-1,Tonodai,Sammu-shi ) | 0475-80-1455 |

< විමසීම් කළ හැකි වේලාවන් > සදුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.15 දක්වා

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 19 දරුවන් ප්‍රාථමික පාසලට සහ කණිෂ්ඨ පාසැලට ඇතුළත් කරන විට කළයුතු දෑ



ජපානයේ, දරුවාට අවුරුදු 6 ලබන අප්‍රේල් මාසයේ සිට අවුරුදු 15 ලබන මාර්තු මාසය දක්වා අතර කාලය තුළ දරුවන් පාසැලේ ඉගෙනුම ලබනවා.

ප්‍රාථමික පාසැලේ අවුරුදු 6 ක කාලයක් ඉගෙනුම ලබනවා.
කණිෂ්ඨද්විතික පාසැලේ අවුරුදු 3 ක කාලයක් ඉගෙනුම ලබනවා.
පාඩම් මාලා ( *Jugyō* ) සඳහා මුදල් වැයවීමක් සිදුනොවේ.
ප්‍රාථමික පාසැල හා කණිෂ්ඨ ද්විතික පාසැල පිළිබඳ විස්තර දැනගැනීම සඳහා නගර සභාවේ < ළමා අධ්‍යාපන අංශය ( *Kodomo Kyōikuka* ) > වෙත පැමිණෙන්න.



<ජපානයේ අධ්‍යාපනය>

| වයස | අවුරුදු6 දක්වා | 7 8 9 10 11 12 | 13 14 15 | 16 17 18 | 19 20 21 22 |
|---|---|---|---|---|---|
| පාසැල | ළමා දිවාසුරකුම් මද්‍යස්ථානය ( *Kodomoen* ) ළදරු පාසැල ( *Yōchien* ) දිවා සුරකුම් මද්‍යස්ථානය ( *Hoikuen* ) | ප්‍රාථමික පාසැල ( *Shōgakkō* ) ( වසර 6 ක් ) | කණිෂ්ඨ උසස් පාසැල ( *Chūgakkō* ) ( වසර 3 ක් ) | උසස් පාසැල ( *Kōtō Gakkō* ) | විශ්වවිද්‍යාලය ( *Daigaku* ) |

## ( 1 ) අතරමගදී පාසැලට ඇතුළත් වීම

ජපානයට පැමිණීමට පෙර ප්‍රාථමික පාසැලේ හා කණිෂ්ඨ උසස් පාසලේ අධ්‍යාපනය ලබාසිටින දරුවන් සිටීනම් < ළමා අධ්‍යාපන අංශය ( *Kodomo Kyōikuka* ) > වෙතින් උපදෙස් ලබාගන්න.
「 පාසැල් මාරු දැනුම්දීමේ පත්‍රය (අතරමගදී පාසලට ඇතුළත් වීමේ අවසර පත්‍රය) ( *Hennyūgaku Tsūchisho* ) 」 නමින් හඳුන්වනුඅතර,මෙම ලියවිල්ල ලබාගෙන මෙහි සඳහන් පාසලට ඇතුළත් විය හැක.

< නගරසභාවට යනවිට රැගෙන යායුතු දේ >

① ජපානයේ හැඳුනුම්පත ( *Zairyū Kādo* )
② විදේශ ගමන් බල පත්‍රය ( පාස්පෝට් එක / *Passport* )



## (2)　ඔබ පදිංචි ස්ථානයට ආසන්නම පාසැලට දරුවා ඇතුළත් කිරීම තීරණය කර ඇත

ඔබ පදිං වී සිටින ප්‍රදේශයේ පාසැල දරුවන් ඉගෙනිමේ කටයුතු සදහා යායුතු පාසැල වශයෙන් තීරණය කර ඇත.සන්මු නගරය ඇතුළත ඇති වෙනත් පාසැල් වලට දරුවාව ඇතුළත් කළ නොහැක.විශේෂ හේතුවක් තිබේනම් පමණක් නගරසභාවේ < ළමා අධ්‍යාපන අංශය ( *Kodomo Kyōikuka* ) > වෙත ගොස් උපදෙස් ලබා ගතහැක.



## (3) පාසැල් ජීවිතය

පාසැලේ ගතකරන කාලය පහත සදහන් ආකාරයට වේ.

ප්‍රාථමික පාසැල එක් කාලපරිච්චේදයක ඉගෙනගන්නා කාලය විනාඩි 45වේ.
කණිෂ්ඨ උසස් පාසැලේ එක් කාලපරිච්චේදයක උගන්වන වේලාව විනාඩි 50වේ.
සෙනසුරාදා සහ ඉරිදා දින නිවාඩු දින වේ.
ප්‍රාථමික පාසැලේ එක් ගුරුවරයෙක් සියලුම විෂයන් උගන්වනු ලැබේ.
කණිෂ්ඨ උසස් පාසලේ විෂයන් ( *Kyōka* ) අනුව උගන්වන ගුරුවරුන්ද　වෙනස් වේ.
ප්‍රාථමික පාසලේ සහ කණිෂ්ඨ උසස් පාසලේ පාසැල් දිවාආහාරය ( *Kyūshoku* ) ලබා දෙනු ලැබේ. දිවා ආහාරය සදහා දෙමාපියන් විසින් මුදල් ගෙවනු ලැබේ.




◎73 පිටුව සහ 74 පිටුවේඅමාරු වචන ◎

※පාඩම් මාලා ( *Jugyō* ) : පාසැලේ දී පාඩම ඉගැන්වීම. දිනපතා ජපන්භාෂාව සහ ගණිතය වැනි විවිධ විෂයන් ඉගෙනුමලබනවා.

※පාසැල් මාරු දැනුම්දීමේ පත්‍රය (අතරමගදී පාසලට ඇතුළත් වීමේ අවසර පත්‍රය) ( *Hennyūgaku Tsūchisho* ) : කුමන පාසැලට ඇතුලත් කරනවාද යනුවෙන් සටහන් කර ඇති ලියවිල්ල.මෙය පාසලට යන පළමු දිනයේදී පාසලට රැගෙන යායුතුයි.

※විෂයන් ( *Kyōka* ) : පාසලේදී උගන්වනු ලබන විෂය මාලාවන්. ජපන් භාෂාව,ගණිතය, විද්‍යාව, සමාජ අද්‍යයනය ආදී විෂයන්

※පාසැල් දිවාආහාරය ( *Kyūshoku* ) : දිවා ආහාරය

| ඉල්ලුම් කරන ස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| ළමා අධ්‍යාපන අංශය<br>( *Kodomo Kyōikuka* ) | 279-1බන්චි,තොනොදයි,සන්මුනගරය<br>( 279-1,Tonodai,Sammu-shi ) | 0475-80-1455 |

< විමසීම් කළ හැකි වේලාවන් > සදුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.15 දක්වා

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 20 පිළිකා පරීක්ෂණය • ශරීරය පරීක්ෂා කිරීම



සන්මු නගරයේ ලියා පදිංචි වී සිටින පුද්ගලයින් සඳහා <u>පිළිකා පරීක්ෂණ සහ සෞඛ්‍ය පරීක්ෂණ</u> සඳහා සහභාගී විය හැක.

ඔබගේ ශරීරයේ සෞඛ්‍ය <u>තත්වයන් පරීක්ෂා කරගැනීම සඳහා පිළිකා පරීක්ෂණ සහ සෞඛ්‍ය පරීක්ෂණ</u> සඳහා ඉල්ලුම් කරන්න.



## (1) <u>පිළිකා පරීක්ෂණ සහ සෞඛ්‍ය පරීක්ෂණ වර්ග කිරීම</u>

ඒ ඒ <u>පරීක්ෂණ සඳහා වසරකට එක් වතාවක්</u> ඉල්ලුම් කළහැක.

| වර්ගය | ආමාශ පිළිකා පරීක්ෂාව | මහ බඩවැලේ පිළිකා පරීක්ෂාව | පියයුරු පිළිකා පරීක්ෂාව | ගර්භාෂ පිළිකා පරීක්ෂාව |
|---|---|---|---|---|
| වයස් ප්‍රමාණය ?<br>පිරිමි / ගැහැණු ? | වයස අවුරුදු 40 ට වැඩි | වයස අවුරුදු 40 ට වැඩි | වයස අවුරුදු 30 ට වැඩි ගැහැණු | 20 ට වැඩි ගැහැණු |
| වැයවන මුදල | යෙන් 1,200 | යෙන් 300 | යෙන් 1,200 | යෙන් 800 |
| කුමන පරීක්ෂණයක්ද යන්න ? | බරිඋමු(යෝගට් දියරය වැනි පැණිරස බීම වර්ගයක්) පානයකිරීම ආමාශයේ එක්ස්රේ | දින දෙකකදීලබාගන්නා අසූචි පරීක්ෂා කිරීම | මැමෝ ග්‍රැෆි හෝ එකෝ | ගර්භාෂයේ සෛල පරීක්ෂා කිරීම |
| උපදෙස් ලබාගත හැකි ස්ථානය | සෞඛ්‍ය උපකාරක අංශය ( *Kenkō Shienka Seijin Hoken Kakari* )<br>0475-80-1171 | | | |

| වර්ගය | වෘෂණකෝෂ වල පිළිකා පරීක්ෂණය | පෙනහළු පිළිකා පරීක්ෂණ ක්ෂයරෝග පරීක්ෂාව | විශේෂිත සෞඛ්‍ය පරීක්ෂණ | මහළුවියේ පසුවන වැඩිහිටියන් සඳහා වෛද්‍ය රක්ෂණය ( *Kōkikōreisha Kenkō Hoken* ) |
|---|---|---|---|---|
| වයස් ප්‍රමාණය ?<br>පිරිමි / ගැහැණු ? | වයස අවුරුදු 50 ට වැඩි පිරිමි | වයස අවුරුදු 40 ට වැඩි | වයස අවුරුදු 40යේ සිට වයස අවුරුදු 74 ජාතික සෞඛ්‍ය රක්ෂණ ( *Kokumin Kenkōhoken* ) ට ඇතුලත් වී ඇති පුද්ගලයින් | වයස අවුරුදු 75 ට වැඩි <u>මහළුවියේ පසුවන වැඩිහිටියන් සඳහා වෛද්‍ය රක්ෂණය</u> ( *Kōkikōreisha Kenkō Hoken* ) |
| වැයවන මුදල | යෙන් 800 | යෙන් 0 | යෙන් 0 | යෙන් 0 |
| කුමන <u>පරීක්ෂණ</u> ? | රුධිර පරීක්ෂා කිරීමෙන් සොයා බැලීම | පපුව එක්ස්රේ කිරීම | උස • බර • රුධිර පීඩනය • වෛද්‍ය වරයා පරීක්ෂණ කිරීම<br>මුත්‍රා • රුධිර පරීක්ෂා<br>බඩ වටේ ප්‍රමාණය මැනීම | උස • බර • රුධිර පීඩනය • වෛද්‍ය වරයා පරීක්ෂණ කිරීම<br>මුත්‍රා • රුධිර පරීක්ෂා කිරීම |
| වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම ) | සෞඛ්‍ය සහන සේවා අංශය ( *Kenkō Shienka* ) වැඩිහිටි රක්ෂණ අංශය<br>0475-80-1171 | | ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ පැන්ෂන් අංශය ( *KokuhoNenkinka* ) ජාතික සෞඛ්‍යරක්ෂණ ප්‍රධාන ( *KokuminKenkōhoken* Kakari)<br>0475-80-1143 | ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ පැන්ෂන් අංශය ( *KokuhoNenkinka* ) <u>මහළුවියේ පසුවන</u> වැඩිහිටි වෛද්‍ය විශ්‍රාම වැටුප් ( *Kōreisha IriyoKakari* )<br>0475-80-1142 |

## (2) අයදුම් කළහැකි ස්ථානය ( කුමන ආකාරයකට අයදුම් කළහැකිද? )

① විශේෂිත සෞඛ්‍ය පරීක්ෂණ

අයදුම් කළහැකි කාලය : අයදුම් කිරීමට හැකි කාල සීමාව තීරණය කර ඇත.

කරුණාකර 「 කණ්ඩායම් ලෙස වෛද්‍ය සායන පරීක්ෂාව පිළිබඳව දැන්වීම් 」 කියවා බලන්න

② මහළුවියේ පසුවන වැඩිහිටියන් සඳහා වෛද්‍ය රක්ෂණය

අයදුම් කළහැකි කාලය : අයදුම් කිරීමට හැකි කාල සීමාව තීරණය කර ඇත.

කරුණාකර 「 කණ්ඩායම් ලෙස වෛද්‍ය සායන පරීක්ෂාව පිළිබඳව දැන්වීම් 」 කියවා බලන්න.

③ පිළිකා පරීක්ෂණ

අයදුම් කළහැකි කාලය:අයදුම් කිරීමට හැකි කාල සීමාව තීරණය කර ඇත.

කරුණාකර සන්මු නගරයේ වෙබ් අඩවිය සොයා බලන්න.



令和３年度
山武市国民健康保険特定健康診査等
集団健診のお知らせ

◆健康診査の種類

| 健(検)診名 | 健(検)診対象者 年齢 | 加入医療保険 | 費用 | 問い合わせ先 |
|---|---|---|---|---|
| 特定健康診査 | 40~74歳 | 国民健康保険 | 無料 | 国保年金課 国民健康保険係 ☎0475(80)1143 |
| 後期高齢者健康診査 | 75歳以上※ | 後期高齢者医療※ | 無料 | 国保年金課 高齢者医療年金係 ☎0475(80)1142 |
| 肺がん・結核検診（胸部エックス線検査） | 40歳以上 | — | 無料 | 健康支援課 成人保健係 ☎0475(80)1171 |
| 前立腺がん検診 | 50歳以上 男性 | — | 800円 | |
| 肝炎ウイルス検診 | 40歳以上 | — | 無料 | |

◆健康診査の受け方

①特定健康診査、後期高齢者健康診査を受診される方

日程をご確認のうえ、予約をしてください。 ➡2~3ページへ

肺がん・結核検診、前立腺がん検診、肝炎ウイルス検診をご希望の方は、同時に受診することができます。

②肺がん・結核検診のみを受診される方

日程をご確認のうえ、直接会場にお越しください。 ➡3ページへ

③前立腺がん検診のみ または 肝炎ウイルス検診のみを受診される方

日程をご確認のうえ、直接会場にお越しください。 ➡3ページへ

◆健康診断における個人情報の取り扱いについて

◆特定保健指導等のお願い

- 1 -

「කණ්ඩායම් ලෙස පවත්වනු ලබන වෛද්‍ය සායන පරීක්ෂාව පිළිබඳව දැනුම් දීම」







◎ 75 පිටුවේ අමාරු වචන ◎

※පිළිකා පරීක්ෂණය・ශරීරය පරීක්ෂා කිරීම : රෝගී තත්වයක් තිබෙද යනවග පරීක්ෂා කිරීම .
පිළිකා පරීක්ෂණයේදී පිළිකා හටගෙන තෙබේදැයි පරීක්ෂා කර බලනු ලැබේ.
විශේෂිත සෞඛ්‍ය පරීක්ෂණ වයස අවුරුදු 40 සිට අවුරුදු 74 දක්වා පුද්ගලයින් ගේ ශරීර සෞඛ්‍යය පිළිබඳවසම්පූර්ණනයෙන් පරීක්ෂා කර බැලීම

<ජාතික සෞඛ්‍ය රක්‍ෂණ ( *Kokumin Kenkōhoken* )යට ඇතුළත් වී ඇති පුද්ගලයින් සඳහා >

මහළුවියේ පසුවන වැඩිහිටියන් සඳහා සෞඛ්‍ය පරීක්‍ෂණය( *Kōkikōreisha Kenkōshinsa* ) අවුරුදු 75ට වැඩිපුද්ගලයින්ගේ ශරීර (*Kōkikōreisha Kenkō Hoken*)සෞඛ්‍යය පිළිබඳව සම්පූර්ණනයෙන් පරීක්‍ෂා කර බැලීම)
(මහළුවියේ පසුවන වැඩිහිටියන් සඳහා වෛද්‍ය රක්‍ෂණයට ඇතුළත් වීසිටින පුද්ගලයින් සඳහා)

※ජාතික සෞඛ්‍ය රක්‍ෂණ ය( *Kokumin Kenkōhoken* ) : රෝහලේදී ඔබ ගෙවන මුදල් ප්‍රමාණය අඩු කිරීම සඳහා භාවිතා කරනු ලබන උපකල්පන ක්‍රමයක් ලෙස නම් කළහැක.
සමාගමේ සෞඛ්‍ය රක්‍ෂණය( *Shakaihoken* ) ට ඇතුළත්වී ඇති පුද්ගලයින් (ජාතික සෞඛ්‍ය රක්‍ෂණ ය( *Kokumin Kenkōhoken* )ට ඇතුළත් වීමට නොහැකිය.

※මහළුවියේ පසුවන වැඩිහිටියන් සඳහා වෛද්‍ය රක්‍ෂණය (*Kōkikoreisha Iryo Hoken*) : වයස අවුරුදු 75ක් වූ විට සියළුදෙනා ඇතුල් ඇතුළත් විය යුතු සෞඛ්‍ය රක්‍ෂණ ය

| වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම් ) | ලිපිනය | දුරකථනඅංකය |
|---|---|---|
| සෞඛ්‍ය උපකාරක අංශය ( *Kenkō Shienka*) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) | 0475-80-1171 |

| විශේෂිත සෞඛ්‍ය පරීක්‍ෂා කරනවිට (*Tokutei Kenkō shinsa*) | ලිපිනය | දුරකථනඅංකය |
|---|---|---|
| ජාතික සෞඛ්‍ය රක්ෂණ සහ විශ්‍රාම අංශය ( *Kokuho Nenkinka* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ⑥ | 0475-80-1143 |

| මහළුවියේ පසුවන වැඩිහිටියන් සඳහා වෛද්‍ය රක්‍ෂණ පරීක්ෂාව සඳහා අයදුම් කිරීමේදී (*Kōkikōreisha Kenkō shinsa*) | ලිපිනය | දුරකථනඅංකය |
|---|---|---|
| ජාතික සෞඛ්‍ය රක්‍ෂණ සහ විශ්‍රාම අංශය ( *Kokuho Nenkinka* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ⑥ | 0475-80-1142 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු5.00 දක්වා වේලාව තුළ
※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 21 ඉඩම් පරිහරණය කිරීමේදී උපදෙස්



ඉඩම් ( බිම් ) පරිහරණය කිරීමේදී නටබුන් ( *Iseki* ) තිබෙනවාදැයි සොයා බැලීමේ අවශ්‍යතාවයක් ඇත.
ගොඩනැගිලි සෑදිමේදීද නටබුන් ( *Iseki* ) තිබෙනවාදැයි සොයා බැලිය යුතුයි.
නටබුන් ( *Iseki* ) යනු පුරාණයේ ජීවත් වූ පුද්ගලයෝ පරිහරණය කළාට පසුව ඉතිරිවන ඉතා වටිනා කොටස් වේ.
නටබුන් ( *Iseki* ) තියෙනවාදැයි පරීක්ෂාකරන විට නගරසභාවේ < ඓතිහාසික මානව කෞතුකාගාරය ( *Rekishiminzoku Shiryōkan* ) > සන්මු නගරයේ ඓතිහාසික සිද්ධීන් පිළිබදව සොයාබලන කෞතුකාගාරය වෙත ගොස් උපදෙස් ලබාගතයුතුයි.
පරික්ෂා කිරිම් අවසන් වූ විට ඔබට බිම සහ ඉඩම් පරිහරණය කලහැකිය.
පොළවේ නටබුන් ( *Iseki* ) තිබුන විට නගරසභාව විසින් පර්යේෂණ පවත්වා වැඩිවිස්තර සොයා බලනු ලබයි.
පරික්ෂා කිරීම සදහා ගතවන මුදල් ඉඩම් පරිහරණය කරන පුද්ගලයා විසින් ගෙවියයුතුයි
පරිහරණය කරනු ලබන බිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර් 1,000ට වඩා විශාල ඉඩමක් වුවහොත් < ඓතිහාසික මානව කෞතුකාගාරය ( *Rekishi Minzoku Shiryōkan* ) > සහ < නාගරික සංවර්ධන අංශය ( *Toshi Seibika* ) > වෙත ගොස් උපදෙස් ලබාගත යුතුයි.



◎ 78 පිටුවේ අමාරු වචන ◎
※නටබුන් ( *Iseki* ) : පැරණි මුතුන්මිත්තන් ජීවත් වූ බව දැනගැනීමට හැකි වටිනා පෞරාණික වස්තූන් ආදිය. පැරණි මුතුන්මිත්තන් පරිහරණයකරන ලද දෑ.ඉතිහාසයේ යුද්ධ සහ විශාල කෝලාහල ආදිය සිදුවී ඉන් ඉතිරිවී ඇති දෑ නටබුන් වශයෙන් හඳුන්වනු ලැබේ.

| වැඩි විස්තර දැනගැනීම සදහා ( විමසීම් ) | ලිපිනය | දුරකථනඅංකය |
|---|---|---|
| සන්මුනගරය,ඓතිහාසික ජාතික කෞතුකාගාරය ( *Rekishi Minzoku Shiryōkan* ) | 343-2 බන්චි,තොනොදයි, සන්මුනගරය ( 343-2,Tonodai,Sammu-shi ) | 0475-53-3023 |

< විමසීම් කළ හැකි වේලාවන් > අගහරුවදා සිට ඉරිදා දක්වා දිනවල පෙරවරු9.00 සිට පස්වරු4.30දක්වා
※කෞතුකාගාරයේ නිවාඩු දින පිළිබදව දුකථන ඇමතුමකින් අසා දැනගන්න.

| ඉඩම 1,000 ㎡ වඩා විශාල අවස්ථාවක | ලිපිනය | දුරකථනඅංකය |
|---|---|---|
| නාගරික සංවර්ධන අංශය ( *Toshi Seibika* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ⑮ | 0475-80-1191 |

< විමසීම් කළ හැකි වේලාවන් > සදුදා සිට සිකුරාදා දක්වා පස්වරු8.30සිට පස්වරු5.15දක්වා
※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 22 වැසිකිළි භාවිතයේදී අනුගමනය කලයුතු දෑ



## (1) සන්මු නගරයේ පවතින වැසිකිළි වර්ග

**ජපානයේ පවතින වැසිකිළි වර්ග දෙකක් ඇත.**

① විෂබීජ නාශක ටැංකිය ( *Jōkasō* ) භාවිතා කරනවැසිකිළි

( මළමුත්‍රා සහ එයින් සේදී යන අපිරිසිදු ජලය පොළොවයට බස්සා ඇති විෂබීජ නාශක ටැංකියකට යෑමට සළස්වා ඇත. ) මෙම ටැංකිය අපිරිසිදු දෑ පිරිසිදු කිරීම සඳහා ඇති විෂබීජ නාශක ටැංකියක් වන අතර එය පොළොව යට වළලා ඇත.

② මළමුත්‍රා එක්රැස් කරගෙන යනු ලබන වැසිකිළි ( *Kumitoru Toire* )

( මෙම වර්ගයේ වැසිකළි වල බිම කුඩා වර්ගයේ ටැංකියක් වළලා ඇත. )

ඔබගේ නිවසේ සදා ඇති වැසිකිළිය කුමන වර්ගයකට අයත් දැයි පරික්ෂාකර බලන්න. වැසිකිළි වර්ගය කුමක්දැයි දැනගත් පසු පහත සදහන් ආකාරයට වැසිකිළිය පිරිසිදු කර ගැනීම සඳහා සුදුසු ආයතනයකට දැනුම් දිය යුතුය.



## (2) වැසිකිළිය භාවිතා කිරීමේදී අනුගමනයකළයුතු අනුපිළිවෙල

① විෂබීජ නාශක ටැංකිය ( *Jōkasō* ) භාවිතා කරනවැසිකිළි

විෂබීජ නාශක ටැංකිය ( *Jōkasō* ) පරීක්‍ෂා ( *Tenken* ) කර බලවා, කරුණාකර එය පිරිසිදු කරවාගන්න.

මෙම ටැංකිය පරීක්ෂණය ( *Tenken* ) ට භාජනය කළයුතු වාර ගණන රටේ නීතිරීති වලට අනුව තීරණය කර ඇත.

පරීක්ෂණය ( *Tenken* ) ට භාජනය කරන අවස්ථාවේ දීම විෂබීජ නාශක ටැංකිය ( *Jōkasō* ) ද පිරිසිදු කරවා ගත යුතු ය.මෙය පිරිසිදු කිරීම එක්වරකට වඩා කළයුතු වේ.

මෙම ටැංකිය පිරිසිදු කරවා ගැනීමේදී පහත සදහන් සේවා ස්ථානයටදුරකථනයෙන් අමතා මෙහි සදහන් ආකාරයට කටයුතු කලයුතුයි.

මෙම සේවා ස්ථානයෙන් ටැංකිය පරීක්‍ෂා ( *Tenken* ) කරවා ගැනීමද සිදුකරාව ගත හැක.

ටැංකිය පරීක්‍ෂා ( *Tenken* ) කරවා ගැනීම සහ එය පිරිසිදු කරවා ගැනීම සඳහා වැයවන මුදල ඔබ විසින් ගෙවිය යුතු වේ.

| වැසිකිළි පිරිසිදු කිරීමේ සමාගම් | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| ඉගරෂි ෂෝකයි ( *Igarashi Shōkai* ) | 171,සෙකිෂිතා,තෝගනෙ ( 171,Sekishita, Togane-shi ) | 0475-58-5249 |
| ෂින්කෝ ඕතාමනේජිමෙන්තො කෝගියෝ ( *Shinkō Wotā Manejimento Kōgyō* ) | 315-5,කතොකු,තෝගනෙ ( 315-5,Katoku, Togane-shi ) | 0475-54-2231 |
| කන්කියෝ එඉසෙඉ සෙන්තා ( *Kankyō Eisei Sentā* ) | 592-1,හිරොසේ,තෝගනෙ ( 592-1,Hirose, Togane-shi ) | 0475-58-2304 |
| වතනබේ සෙයිසෝ ( *Watanabe Seisō* ) | 323-18,හිගෂිනකා,තෝගනෙ ( 323-18,Higashinaka,Togane-shi ) | 0475-58-3308 |

| වැසිකිළි පිරිසිදු කිරීමේ සමාගම් | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| කයිජෝ කසෝ ( *Kai Jōkasō Sābisu* ) | 513-1,ෂිහොසොකුසා,ඕඅමිශිරසතෝ<br>( 513-1,Hosokusa, Oamishirasato-shi ) | 0475-77-1717 |
| *නරුතෝ ජෝකසෝ සෙන්තා*<br>*( Narutō Jōkasō Sentā )* | 703-1,ත්සුබෙ,සන්මුනගරය<br>( 703-1,Tsube, Sammu-Shi ) | 0475-82-0202 |

මීට අමතරව වසරකට එක වතාවක් <u>විෂබීජ නාශක ටැංකිය ( *Jōkasō* )</u> පරීක්ෂණයට භාජනය කරවා ගැනීම ජපානයේ නිතිරීති යටතේ තීරණය කර ඇත.වැඩි විස්තර සඳහා කරුණාකර වෙබ් අඩවිය පරීක්ෂා කර බලන්න.

චිබා ප්‍රාන්තයයේ වෙබ් අඩවිය

https://www.pref.chiba.lg.jp/suiho/kasentou/joukasou/houteikensa.html

② මළමුත්‍රා එක්රැස් කරගෙන යනු ලබන වැසිකිළි ( *Kumitoru Toire* )

මළමුත්‍රා එක්රැස් කරගෙන යනු ලබන ( *Kumitoru* ) වර්ගයේ වැසිකිළි භාවිතා කිරීමේදී නගරසභාවේ ලියාපදිංචි කිරීම අවශ්‍ය වේ.

නගරසභාවේ < පරිසර සංරක්ෂණ අංශය ( *Kankyō Hozenka* ) > ට යට ගොස් ලියාපදිංචි වියයුතුයි.

පහත සඳහන් සමාගම් විසින්ද මළමුත්‍රා එක්රැස් කරගෙන යනු ලබයි.

| වැසිකිළි පිරිසිදු කිරීමේ සමාගම | දුරකථන අංකය |
|---|---|
| ඉගරෂි ෂෝකයි ( *Igarashi Shōkai* ) | 0479-82-3586 |

මළමුත්‍රා එක්රැස් කරගෙන යන කාර්යය සඳහා මුදල් වැයවේ.

ඔබ විසින් ඒ සඳහා වැයවන මුදල් ගෙවියයුතු වේ.

මුදල් ගෙවීම සඳහා අවශ්‍ය වන බිල්පත මාස දෙකකට වතාවක් තැපැල් මගින් ඔබගේ නිවසට එවනු ලැබේ.

මුදල් ගෙවීම අමතක වුවොත් මළමුත්‍රා එක්රැස් කරගෙන යනු ලබන ( *Kumitoru* ) සේවාව සිදු කරනු නොලැබේ.කරුණාකර අමතක නොකර මේ සඳහා වැයවන මුදල් ගෙවා අවසන් කරන්න.






මුදල් ගෙවීමට ඇති රිසිට්පත

මළමුත්‍රා එක්රැස් කරගෙන යනු ලබන ( *Kumitoru* ) සේවය අත් හිටුවීමේදී නැවත නගර සභාවට ගොස් < පරිසර සංරක්ෂණ අංශය ( *Kankyō Hozenka* ) > ට අනිවාර්යයෙන්ම එම සේවයෙන් ඉවත් වීම සඳහා වූ ඉල්ලුම් පත් පුරවා භාරදිය යුතු වේ.

< *නගරසභාවට යනවිට රැගෙන යායුතු දේ* >
ජපානයේ හැඳුනුම්පත ( *Zairyū Kādo* ) ඔබගේ නම සහ ලිපිනය සඳහන් කිරීමට හැකි හැඳුනුම් පතක්







— සටහන් —

◎ 78 සහ79 වෙනි පිටුවේ අමාරු වචන◎
※විෂබීජ නාශක වැංකිය ( *Jyōkasō* ) : මළමුත්‍රා සහ එයින් සේදී යන අපිරිසිදු ජලය පිරිසිදුකරන යන්ත්‍රය.පොළොව යට වළලාඇත.
※පරික්ෂාකිරීම( *Tenken* ) : විෂබීජ නාශක වැංකියේ ක්‍රියාකාරීත්වය නිසියාකාරව සිදුවෙනවා දැයි පරීක්ෂා ර බලන්න.

| වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම ) | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| පරිසර සංරක්ෂණ අංශය ( *Kankyō Hozenka* ) | 296බන්චි,තොනොදයි,සන්මු නගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ⑯ | 0475-80-1161 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්කවා පෙරවරු8.30සිට පස්වරු5.15 දක්වා වේලාව තුළ
※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 23 බල්ලෝ සහ පූසෝ



බල්ලන් සහ පූසන් සුරතලුන් ලෙස ඇතිකිරීම සඳහා මිළ දී ගත් විට හොඳින් රැකබලා ගන්න.




## (1) බල්ලන් ඇතිකරන විට

### ① බල්ලාව <u>ලියාපාදිංචි</u> කිරීම

බල්ලන්ව අසුරතලුන් වශයෙන් ඇති කිරීමේදී දිනයේ සිට දින 3 0 ක් ඇතුළත නගරසභා කාර්යාලයට පැමිණෙන්න .

කරුණාකර බල්ලාව <u>ලියාපදිංචි</u> කරන්න.

කුඩා බලු පැටියෙක් ඉපදී දින 9 0 ක් ගත වීමෙන් පසු කරුණාකර බලු පැටියාව <u>ලියාපදිංචි</u> කරන්න.






### ② බල්ලන් සඳහා ලබාදෙන එන්නත් පිළිබඳව

<u>ජලභීතිකා රෝගය ( *Kyōkenbyō* )</u> සැදීමෙන් වැලකීම සඳහා පශු වෛද්‍ය රෝහලකට ගොස් එන්නත් විදීම අවශ්‍ය වේ.

එන්නත් විදීමෙන් පසු 「<u>ජලභීතිකා එන්නත් සහතිකය ( *Kyōkenbyō Yobōchūshaszumishō* )</u> 」 රැගෙන නගර සභාවට පැමිණෙන්න. කරුණාකර නගර සභාවෙන් 「<u>ජලභීතිකා එන්නත ලබා ඇති බවට නිකුත් කරන ලියවිල්ල ( *Kyōkenbyō Yobōchūshazumihyō* )</u> 」 ලබාගන්න.

සෑම වර්ෂයකටම වතාවක් එන්නත් ලබාදිය යුතුයි.

බල්ලාව ලියාපදිංචිකිරීම සහ එන්නත් ලබාගැනීම නීතිමය වශයෙන් තිරණය කරඇත.

කරුණාකර මෙම එන්නත ලබාගන්න.

### ③ ලියාපදිංචි ගාස්තුව



<u>ලියාපදිංචිය සඳහා වැයවන කොමිෂන් ගාස්තුව ( *TōrokuTesūryō* )</u> යෙන් 3,000

<u>නිකුත් කිරීමේ ගාස්තුව ( *Chūshazumihyō kofutesūryō* )</u> යෙන් 550.

මුලික එකතුව යෙන් 3,550.

බල්ලන්බොහෝ සිටනවිට ( බල්ලන් 10 ට වඩා ) සහ බල්ලන්ව සුරතලුන් වශයෙන් සෑදීම සඳහා මිළදී ගන්නා විට සන්මු සෞඛ්‍ය මධ්‍යස්ථානය ( *Sammu Hokenjyō* ) වෙත දැනුම් දෙන්න.

## (2) පූසන් සුරතලුන් වශයෙන් සැදීම සඳහා  මිළදී ගන්නා විට



පූසන් නිවසේ  ඇතුළේ ඇතිකරන්න.

පූසන්ගේ අසූචි සහ විශාල හඩින් කෑගැසීමේදී අසල්වාසීන්ට කරදරයක් වනු ඇත.

පූසන්ට වඳභාවය ඇතිකිරීම සඳහා සිදුකරන සැත්කම ( *Funin Kyōsei shujyutsu* ) සිදුකරාව ගන්න.

පූසාව අතරමං නොවන ලෙස ( නැතිවූවිට හඳුනා ගන්නා කාඩ්පත *Maigo Fuda* ) හෝ සියුම් චිප් ( *Maicurochippu* ) එකක් පූසාගේ ඇගේ එල්ලා තබන්න.

අයාලේ යන පූසන් ට කෑම දීමෙන් වලකින්න.

අයාලේ යන පූසන් ට කෑමදුන් විට ඔබ එම පූසන්ව රැක බලා ගන්න.




◎ 81 පිටුවේ සහ 83 පිටුවේ අමාරු වචන ◎

※ලියා පදිංචිය : ඔබ බල්ලන්ව අසුරතලුන් වශයෙන් ඇති කිරීමේදී නගර සභාවේ ලියාපදිංචි කිරීම අවශ්‍ය වේ.

※ජලභීතිකා රෝගය ( *Kyōkenbyō* ) : බල්ලන්ට වැළඳෙන රෝගී තත්වය.

※ලියාපදිංචි සඳහා වැයවන කොමිෂන් ගාස්තුව ( *TōrokuTesūryō* ) : බල්ලා ව ලියාපදිංචි කරන විට ගෙවනු ලබන මුදල්.

※නිකුත් කිරීමේ ගාස්තුව (*Chūshazumihyō kofutesūryō*) : ජලභීතිකා එන්නත ලබා ඇති බවට නිකුත් කරන ලියවිල්ල ( *Chūshazumihyō* ) ලබාගැනීමේදී නගර සභාවට ගෙවනු ලබන මුදල්.

※සෞඛ්‍ය මධ්‍යස්ථානය ( *Sammu Hokenjyō* ) : සන්මු සෞඛ්‍ය මධ්‍යස්ථානය ( *Sammu Hokenjyō* )

ස්ථානය : 〒283-0802 චිබා ප්‍රාන්තය, චිබා නගරය චිබා 907-1

දුරකථන අංකය : 0475-54-0611

※පූසාට වඳභාවය ඇතිකිරීම සඳහා සිදුකරන සැත්කම ( *Funin Kyōsei shujyutsu* ) : පූසන්ට පැටව් ඉපදීම නැතිකිරීම සඳහා කරනු ලබන සැත්කම ලෙස හඳුන්වනු ලැබේ.

| වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම් ) | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| පරිසර සංරක්ෂණ අංශය ( *Kankyō Hozenka* ) | 296බන්චි,තොනොදයි,සන්මු නගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක⑯ | 0475-80-1161 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා පස්වරු8.30සිට පස්වරු5.15දක්වා

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29 වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

# 24 මෙවැනි අවස්ථාවක කුමක් කළයුතුද? Q&A

එදිනෙදා ජීවිතයේ දී අපහසුතාවයකට පත්වූ විට කුමක් කළයුතුද යන්න මෙම පිටුවේ විස්තර කර ඇත.
ඔබට යම් අපහසුතාවයක් ඇති වූ විට පහත සදහන් කර ඇති ප්‍රශ්ණ සහ ඒ සදහා විස්තර කරඇති පිළිතුරු පිළිබදව කියවා බලන්න.

## Q1 පෞද්ගලික අංකය අසහිත කාඩ්පත ( *My Nanbā Kādo* ) වලංගු කාලය ලංවූ විට

**A** පෞද්ගලික අංකය අසහිත කාඩ්පතේ ( *My Nanbā Kādo* ) වලංගු කාලය ඔබගේ ජපානයේ හැදුනුම්පතේ ( *Zairyū Kādo* ) වලංගු කාලයට හා සමාන වේ.
ජපානයේ හැදුනුම්පතේ ( *Zairyū Kādo* ) කාලසීමාව දීර්ඝ වූ විට පෞද්ගලික අංකය සහිත කාඩ්පතේ ( *My Nanbā Card* ) වලංගු කාලද දීර්ඝ කිරීම කළහැක.
නගර සභා කාර්යාලයේ < මහජන සම්භන්ධතා අංශය ( *Shiminka* ) > සහ අනුබද්ධ නගර සභා කාර්යාලවලදී ඉල්ලුම්කිරීම් කළහැක
පෞද්ගලික අංකය අසහිත කාඩ්පතේ ( *My Nanbā Kādo* ) වලංගු කාලය අවසන් වුවහොත් නැවත නිකුත් කිරීමට මුදල් වැයවේ.

| | |
|---|---|
| **අයදුම් කරන විට** | ජපානයේ හැදුනුම්පත ( *Zairyū Kādo* ) පදිංචිතත්වය ( ජපානයේ ජීවත් වීමේ විසා වර්ගය ) වෙනස් වූවිට<br>ජපානයේ හැදුනුම්පත ( *Zairyū Kādo* )පදිංචි කාලය දික්වූ විට. |
| **රැගෙන යායුතු දෑ (සියල්ලම)** | ① ජපානයේ හැදුනුම්පත ( *Zairyū Kādo* )<br>② පෞද්ගලික අංකය සහිත කාඩ්පත ( *My Nanbā Kādo* ) |

■ වැඩි විස්තර දැනගැනීම සදහා විමසීම් : මහජන සම්භන්ධතා අංශය ( *Shiminka* ) කවුළු අංක ⑤
■ දූරකථන අංකය : 0475-77-8110
■ මේ පිළිබද සම්භන්ධතා පිටු : 22 වෙනි පිටුවේ සිට 23 වෙනි පිටුව දක්වා







## Q2 සැහැල්ලු වාහන ( කේ වාහන ) කැබලි කිරීමේදී ඊට පසුව බදු ගෙවීම සදහා ලිපි එවනු ලැබේ

**A** කුඩා වාහන ( කේ වාහන ) කැබලි කිරීමේදී පහත සදහන් ක්‍රියා පටිපාටිය අනුගමනය කලයුතුය

මෙම ක්‍රියා පටිපාටිය අනුගමනය නොකළහොත් බදු ගෙවීම සදහා ලිපි යවනු ලැබේ.

| | |
|---|---|
| ඉල්ලුම් කිරීමේදී | සැහැල්ලු වාහන ( කේ වාහන ) කැබලි කර ඉවත් කිරීමේදී |
| ලියාපදිංචි වන්නේ කුමක්ද | වාහන පරීක්ෂණ සහතිකයේ ( *Shakensho* ) තොරතුරු ලියාපදිංචිය ඉවත් කිරීමෙ ( *Masshōtetsuzuki* ) ක්‍රියා පටිපාටිය අනුගමනය කලයුතුය. |
| ලියාපදිංචි වන ස්ථානය | සැහැල්ලු මෝටර් රථ පරීෂණ සංවිධානය<br>( *KeiJidōshakensa Kyōkai* ) ( *Chiba Jimusho* )<br>චිබා කාර්යාලය<br>ස්ථානය : Shin minato,Mihamaku,<br>Chibashi,Chiba Ken223-8<br>දුරකථන අංක : 050-3816-3114 |

■ වැඩි විස්තර දැනගැනීම සදහා විමසීම් : බදු අංශය ( *Kazeika* ) කවුළු අංක ⑦
■ දුරකථනඅංකය : 0475-80-1281
■ මේ පිළිබද සම්භන්ධතා පිටු : 28




## Q3 වීසා අළුත් කිරීමේදී ආධායම් වාර්තා අවශ්‍ය වූ විට

**A** ආධායම් වාර්තාව ලබාගැනීමේදී පසුගිය වර්ෂයේ ආධායම් වාර්ථාව ට අදාලව ඔබට වාර්ෂික ආධායමක් ඇතිබව දැනුම් දෙන්න.

ආධායම පිළිබදව දැනුම් දීමෙන් පසුව ආධායම් වාර්ථාව නිකුත් කිරීමට දින කිහිපයක් ගතවේ.

ඉක්මනින් බදු අංශයට ගොස් ඔබගේ ආධායම් පිළිබදව දැනුම් දෙන්න.

■ වැඩි විස්තර දැනගැනීම සදහා විමසීම් : බදු අංශය ( *Kazeika* ) කවුළු අංක ⑦
■ දුරකථන : 0475-80-1281
■ මේ පිළිබද සම්භන්ධතා පිටු , පිටු අංක 29 සහ 32 පිටුව



## Q4 ජපානයේ පිහිටුවා ඇති සමාගමක කලමනාකරණය සිදුකරන ප්‍රධානියා සහ යම් සමාගමක් සන්මු නගරයෙන් වෙනත් නගරයකට පිහිටුවීමට යන විට සහ වෙනත් නගරයක සිට සන්මු නගරයේ පදිංචියට පැමිණි විට සමාගමේ ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය වන දෑ මොනවාද ?

**A** නගරසභා කාර්යාලය < බදු අංශය ( *Kazeika* ) > දීපහත සඳහන් ක්‍රියා පටිපාටිය අනුගමනය කරන්න.

| | |
|---|---|
| ලියාපදිංචි වන විට | ජපානයේ සමාගමක් පවත්වාගෙන යන ප්‍රධානියා සහ එම සමාගම<br>・සන්මු නගරයෙන් ඉවත්වී යනවිට ( සන්මු නගරයෙන් පිටවීම )<br>・සන්මු නගරයේ පදිංචියට එනවිට ( සන්මු නගරයේ පදිංචි වීම ) |
| ලියාපදිංචි කරන නම | සංස්ථා වල ස්ථාන මාරුකිරීම් පිළිබඳව දැනුම්දීම<br>( *Hōjin no Idōtodoke* ) |
| අවශ්‍ය ලියකියවිලි ( සියල්ලම ) | ① සමාගම පිළිබඳව දැනුම් දීමේ පත්‍රිකාව ( *Hōjintōtodokedesho* )<br>② සියළුම ඓතිහාසික කරුණු පිළිබඳ සහතිකය<br>( *Rirekijikōzenbu shōmeisho* ) |
| ඉල්ලුම් සිදුකරන ස්ථානය | බදු අංශය ( *Kazeika* )<br>ස්ථානය : ජපානයේ සමාගමක කලමනාකරණය<br>දුරකථන අංක : 0475-80-1281 |

■ වැඩි විස්තර දැනගැනීම සඳහා විමසීම : බදු අංශය ( *Kazeika* ) කවුළු අංක ⑦
■ දුරකථන : 0475-80-1281

## Q5 ජපානයේ සමාගමක් කලමනාකරණය කිරීමේදී එම සමාගමේ බදුවර්ග මොනවද?

**A** සෑම වසරකම සමාගමේ වැඩකරන වර්ෂයක් අවසන් වන දිනයේ ,ඊලග දිනයේ සිට මාස 2 ක් ගතවනදිනට පෙර ආධායම් වාර්ථා සකස්කොට කරුණාකර ඊළග බදු මුදල් ගෙවා අවසන් කරන්න.

| | |
|---|---|
| ආයතනික බදු ( *Hōjinzei* ) | බදු කාර්යාලයට ගෙවන බදු |
| ආයතනික ව්‍යාපාර බදු | ප්‍රාන්තයට ගෙවන බදු |
| ආයතනික නේවාසික බදු | නගරසභාවට ගෙවන බදු |

■ වැඩි විස්තර දැනගැනීම සඳහා විමසීම : බදු අංශය ( *Kazeika* ) කවුළු අංක ⑦
■ දුරකථන : 0475-80-1281



# Q6 නිවසේ කුණුකසළ ඉවත දමන්නේ කුමන ස්ථානයකටද ?

**A** කුණුකසල ඉවත දැමීම ඔබ ජීවත්වන ප්‍රදේශය අනුව වෙනස් වේ. ඔබ පදිංචි වී සිටින ප්‍රදේශය පිළිබඳව වැඩි විස්තර දැනගැනීම සඳහා මෙම පොතේ 34 වෙනි පිටුව සහ 35 වෙනි පිටුව පරික්ෂා කර බලන්න.

| | |
|---|---|
| නිවස අසල තිබෙන කුණුකසළ දමනස්ථානය ( Gomi Station ) කුණුකසළ ඉවත දැමීමේ ක්‍රම | ① අදාළ ප්‍රදේශය සඳහා තීරණය කරඇති කුණු දැමීමේ කවර මිළදී ගත යුතුයි .<br>② තීරණයකරඇති ස්ථාන < කුණුකසළ දමනස්ථානය > ට කරුණාකර කුණුකසළ ඉවත දමන්න.<br>කුණුකසළ දමනස්ථානය පිළිබඳව අසල් වාසීන්ගෙන් අසා දැනගනිමහෝ නගරසභා කාර්යාලයේ < වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම් ) පරිසර සංරක්ෂණ අංශය ( *Kankyō Hozenka* ) පරීක්ෂා කර බැලිය හැක.<br>【 පහත සඳහන් දෑ පිළිබඳව කරුණාකර ප්‍රවේසම් වන්න ! 】<br>• කුණුකසළ දමන ස්ථානය හැර වෙනත් ස්ථාන වලට කුණුකසළ දැමූ විට හන්ධනාගාර ගතවීමටහෝ ඒ සඳහා දඩමුදලක් ගෙවීමට සිදුවේ.<br>• කුණුකසළ දමනස්ථානය ( Gomi Station ) අසල් වාසීන් විසින් කළමනාකරණය කරනු ලැබේ. කුණුකසළ දමනස්ථානය ( Gomi Station ) භාවිතා කිරීමේදී අසල්වසින්ගෙන් විමසා බලන්න.<br>• සන්මු , මත්සුඕ , හසුණුම ප්‍රදේශ වල පදිංචි වී සිටින පුද්ගලයින්ට කුණුවර්ග අනුව , කුණු දමන ස්ථාන වෙනස් වන අවස්ථා ඇත. |
| කුණුකසළ බැහැර කිරීමේ මධ්‍යස්ථාන දක්වා කුණුකසළ රැගෙන යාමේ ක්‍රමය | කුණුකසළ රැගෙන යැමට පෙර පහත සඳහන් ස්ථාන වලට කරුණාකර දුරකථනයෙන් අමතන්න.<br>• සම්බු , මත්සුඕ, හසුණුම ප්‍රදේශවල පදිංචිවී සිටින පුද්ගලයින් සන්බුගුන්ෂි කන්ක්යෝඑඉසෙඉ කුමිඅයි ( *Sanbugunshi Kankyōeisei Kumiai* )<br>ස්ථානය : සන්මු නගරය, මත්සුඔමචි, කන්ඕ 1149-1<br>( Samushi,Matsuomachi kano 1149-1 )<br>දුරකථන අංකය : 0479-86-3516<br>• නරුතෝ ප්‍රදේශයේ පදිංචි පුද්ගලයින්<br>තොගනෙෂි , හොකසන්ෂිමචි ,කන්ක්යෝ කුරින් සෙන්තා<br>( Toganeshi Hokasanshimachi Kankyō Kurīn Sentā )<br>ස්ථානය : 340,මිකජිරි, තොගනෙ නගරය<br>( 340, Mikajiri, Togane-shi )<br>දුරකථන අංකය : 0475-50-9141<br>【 පහත සඳහන් කරුණ පිළිබඳව ප්‍රවේශම් වන්න. 】<br>• කුණු රැගෙන යන විට මේ සඳහා තිරණය කරනු ලැබූ කුණුබහාලන කවර වෙන් කර නැත. |

ⓘ
■ වැඩි විස්තර දැනගැනීම සඳහා විමසීම් : පරිසර සංරක්ෂණ අංශය ( *Kankyō Hozenka* ) කවුළු අංක ⑯
■ දුරකථන : 0475-80-1163
■ මේ පිළිබඳ සම්බන්ධතා පිටු : 33පිටුවේ සිට58 පිටුව දක්වා

## Q7 කුණු කවර වලට දැමීමට නොහැකි විශාල වර්ගයට අයත් කුණුවලට කුමක් කළයුතුද ?

**A** කුණුකසල ඉවත දැමීම ඔබ ජීවත්වන ප්‍රදේශය අනුව වෙනස් වේ

ඔබ පදිංචි වී සිටින ප්‍රදේශය මෙම පොතේ 34 පිටුවේ සහ 35 පිටුවේ පරික්ෂා කර බලන්න.

කුණු කවර වලට දැමීමට නොහැකි වශාල වර්ගයට අයත් කුණු, පහත සදහන් ස්ථානවල දී එක්කාසු කරනු ලැබේ.

කුණු එක්කාසු කිරමේ දිනය පිලිබදව දුරකථන ඇමතුමකින් තීරණය කළහැක.

කුණු එක්කාසු කිරීමේ ගාස්තුව දුරකථන ඇමතුමක් මගින් විමසා දැනගන්න.



| | |
|---|---|
| සන්බු , මත්සු , හසුණුම ප්‍රදේශයේ පදිංචිවී සිටිනපුද්ගලයින් සදහා | සන්බුගුන්ෂි කන්ක්යෝඑඉසෙඉ කුමිඅයි<br>( *Sanbugunshi Kankyōeisei Kumiai* )<br>දුරකථන අංකය : 0479-86-3516 |
| නරුතෝ ප්‍රදේශයේ පදිංචි වී සිටින පුද්ගලයින් සදහා | තොගනෙෂි ,හොකසන්ෂිමචි,  කන්ක්යෝ කුරින් සෙන්තා<br>( *Toganeshi Hokasanshimachi Kankyō Kurīn Sentā* )<br>දුරකථන අංකය : 0475-50-9141 |

■ වැඩි විස්තර දැනගැනීම සදහා විමසීම : පරිසර සංරක්‍ෂණ අංශය ( *Kankyō Hozenka* ) කවුළු අංක ⑯

■ දුරකථන : 0475-80-1163

■ මේ පිළිබද සම්බන්ධතා පිටු : 33 වෙනි පිටුවේ සිට 58 වෙනි පිටුව දක්වා

## Q8 ප්‍රදේශවලට අනුව තිරණයකර ඇති කුණුබහාලීමේ කවර මිළට ගන්නේ කුමන ස්ථාන වලින්ද ?

**A** කුණුකසල ඉවත දැමීම ඔබ ජීවත්වන ප්‍රදේශය අනුව වෙනස් වේ

ඔබ පදිංචි වී සිටින ප්‍රදේශය පිළිබදව වැඩි විස්තර දැනගැනීම සදහා කරුණාකර මෙම පොතේ 34 වෙනි පිටුව සහ 35වෙනි පිටුව පරික්ෂා කර බලන්න.

කුණුකසල බහාලන කවර ඔබට ආසන්න කොන්බිනි, වෙළදසල්,ආදියෙන් මිළදී ගැනීමට හැකියාව ඇත.

ඔබ පදිංචි ප්‍රදේශයේ තීරණය කරඇති කුණුකසල බහාලන කවර කරුණාකර මිළදී ගන්න.

ඔබ පදිංචි ප්‍රදේශය හා ඉවත ලන කුණුකසල වර්ගය අනුව කුණුකසල බහාලන කවරවලද වෙනස් වේ.

කුණුකසල වර්ගීකරණයට අනුව අදාළ නොවන කවර වලට කුණුකසළ දමා ඉවත දැමිය නොහැක.

සම්බු , මත්සුඹ , හසුණුම ප්‍රදේශය




නරුතෝ ප්‍රදේශය






※මෙම පිංතූර යේ සදහන් වන්නේ දිරාපත් වන කුණුකසළ ( *Moeru Gomi* ) < *Kanen Gomi* > කවර වේ.

ⓘ

■ වැඩි විස්තර දැනගැනීම සඳහා විමසීම් : පරිසර සංරක්ෂණ අංශය ( *Kankyō Hozenka* ) කවුළු අංක ⑯

■ දුරකථන අංකය : 0475-80-1163

■ මේ පිළිබඳ සම්බන්ධතා පිටු : 33වෙනි පිටුවේ සිට 58 වෙනි පිටුව දක්වා

## Q9 සැන්පු සහ භාජන සෝදන සබන් දියරවර්ග , ප්‍රතිචක්‍රීකරණයට භාජනය කරනු ලබන කුණුකසල ( Sigen Gomi ) ( ප්ලාස්ටික් බෝතල් ) ලෙස ඉවත දැමීමට හැකියාවක් තිබෙනවාද ?

**A** සැන්පු සහ භාජන සෝදන සබන් දියරවර්ග දමා ඇති බෝතල් ආදිය, ප්‍රතිචක්‍රීකරණයට භාජනය කරනු ලබන කුණුකසල ( *Sigen Gomi* ) ( ප්ලාස්ටික් බෝතල් ) ඉවත දැමීම කළනොහැක.

පහත සඳහන් ප්‍රතිචක්‍රීකරණ ලාංචනය සඳහන් දැ දමා ඇති බෝතල් ආදිය ප්‍රතිචක්‍රීකරණයට භාජනය කරනු ලබන කුණුකසල ( *Sigen Gomi* ) ( ප්ලාස්ටික් බෝතල් ) ලෙස ඉවත දැමිය හැක.




ප්‍රතිචක්‍රීකරණයට භාජනය කරනු ලබන කුණුකසල ( Sigen Gomi ) ( ප්ලාස්ටික් බෝතල් )

ප්‍රතිචක්‍රීකරණ ලාංචනය නැති වර්ගයන් දිරාපත්වන කුණු ( *Kanen Gomi* ) ,< Moeru Gomi >දැමිය හැකි කවර වලට බහාලා ඉවත දමන්න.

★ ප්‍රතිචක්‍රීකරණ ලාංචනය සඳහන් නොවන බහාලුම් උදාහරණ




දිරාපත්වන කුණු (*KanenGomi*) , <*Moeru Gomi* >

ⓘ

■ වැඩි විස්තර දැනගැනීම සඳහා විමසීම් : පරිසර සංරක්ෂණ අංශය ( *Kankyō Hozenka* ) කවුළු අංක ⑯

■ දුරකථන අංකය : 0475-80-1163

■ මේ පිළිබඳ සම්බන්ධතා පිටු : 33 වෙනි පිටුවේ සිට 58 වෙනි පිටුව දක්වා

## Q10 තමා විසින් ඉවත දැමූකුණුකසළ, කුණුකසළ රැගෙන යන පුද්ගලයින් විසින් රැගෙන ගියේ නැත.එයට හේතුව කුමක් ද ?

**A** කුණුකසළ රැගෙන යන පුද්ගලයින්ට පහත සදහන් කුණුකසළ රැගෙන යානොහැකිය .

| | |
|---|---|
| **රැගෙන යා නොහැකි කුණුකසළ** | කුණුකසළ එක්රැස් නොකරන දිනයක ඉවත දැමූ කුණු වර්ග. |
| **ඒසදහා කුමක් කළයුතුද?** | කුණුකසළ එක්රැස් කරනු ලබන දිනයකදී කරුණාකර කුණු ඉවතදමන්න.<br>කුණුකසළ එක්රැස් කරනු ලබන දිනය කුණුකසළ එක්රැස්කිරීමේ කැලැන්ඩයෙන් පරීක්ෂා කර බලන්න. |

| | |
|---|---|
| **රැගෙන යානොහැකි කුණුකසළ** | කුණුකසළ වර්ගීකරණය නොකර ඉවත දැමූ කුණු වර්ග |
| **ඒසදහා කුමක් කළයුතුද?** | රැගෙන යැමට නොහැකි කුණුකසළ වර්ගවල කවරයේ කඩදාසියක් අලවා ඇත.<br>එම කඩදාසියේ එක්කාසු කිරීමට නොහැකි හේතුව සටහන්කරඇත.<br>කරුණාකර කුණුකසළ වර්ගීකරණය කිරීමෙන් පසුව බැහැර කරන්න.<br>කුණුකසළ වර්ගීකරණය පිළීබදව මෙම අත්පොතේ 36පිටුවේ සිට 58 පිටුව දක්වා කියවා බලන්න. |

■ වැඩි විස්තර දැනගැනීම සදහා විමසීම : පරිසර සංරක්‍ෂණ අංශය ( *Kankyō Hozenka* ) කවුළු අංක ⑯
■ දුරකථන අංකය : 0475-80-1163
■ මේ පිළිබද සම්භන්ධතා පිටු : 33 වෙනි පිටුවේ සිට 58 වෙනි පිටුව දක්වා.

කවදා කොහේට කුමන වර්ගයේ කුණු කසළ ඉවත් කරනවාද යනවග තීරණය කර ඇත !





## Q11 කුණුකසල ඉවත දැමිය හැක්කේ කවදාටද ?

**A** කුණුකසල ඉවත දැමීම ඔබ ජීවත්වන ප්‍රදේශය අනුව වෙනස් වේ.
ඔබ පදිංචි වී සිටින ප්‍රදේශය මෙම පොතේ , 34 පිටුව සහ 35 පිටුව පරික්ෂා කර බලන්න.




කරුණාකර කුණුකසළ තීරණය කරඇති දිනවල උදේ ඉවත දමන්න.
සන්මු , මත්සුඕ , හසුණුම ප්‍රදේශය・・・උදේ වරුවේ 8 . 3 0 ට පෙර ඉවත දමන්න.
නරුතෝ ප්‍රදේශය・・・උදේ වරුවේ 8 ට පෙර ඉවත දමන්න.

පෙර දිනයේ රාත්‍රියේ වෙනත් වේලාවන් වලදී කුණුකසළ ඉවත දැමීමෙන් අසල්වාසීන්ටද කරදර කාරී තත්වයක් ඇතිවේ.
කුණුකසළ ඉවත දමා ඇතිවිට සිවුපාසතුන් එතනට පැමිණ කුණුකවර ඇවිස්සීම සිදුකරන අතර, එවිට කුණුකසළ තුළින් දුර්සන්ධයන් ද පිටවේ.

ⓘ
■ වැඩි විස්තර දැනගැනීම සඳහා විමසීම් : පරිසර සංරක්‍ෂණ අංශය ( *Kankyō Hozenka* ) කවුළු අංක ⑯
■ දුරකථන අංකය : 0475-80-1163
■ මේ පිළිබඳ සම්බන්ධතා පිටු : 33වෙනි පිටුවේ සිට 58 පිටුවදක්වා

## Q12 නිවසේ කුණුකසළ බැහැර කිරීමේදී එම කුණු කසළ බැහැර කිරීම සඳහා යහළුවන්ට සහ හිතවත් පුද්ගලයින්ට ඉල්ලීම් කලාට කමක්නැද්ද ?

**A** වෙනත් පුද්ගලයෙකුගේ කුණු කසළ රැගෙන යාමේදී අවසර ගැනීමක් අවශ්‍ය වේ.
කුණු කසළ රැගෙන යාම සඳහා ඉල්ලුම් කලවිට , මේ සඳහා අවසර ලබාගෙන සිටින පුද්ගලයින්ට පමණක් එම කාර්යය භාර දෙන්න.
වැඩි විස්තර දැනගැනීම සඳහා මෙම අත්පොතේ 46 පිටුව සහ 47 පිටු ( නරුතෝ ප්‍රදේශය ) 57 වෙනි පිටුව( සම්බු , මත්සුඕ , හසුණුම ) කියවා බලන්න.
කුණු කසළ රැගෙන යාම සඳහා ඉල්ලුම් කරන පුද්ගලයින්ට ඒ සඳහා අවසර තිබේදැයි යන්න පරික්ෂා කිරිම සඳහා පහත සඳහන් දුරකථනයෙන් අමතන්න.

නරුතෝ ප්‍රදේශය・・・සන්මු නගර සභාව < පරිසර සංරක්‍ෂණ අංශය ( *Kankyō Hozenka* ) >
( දුරකථන අංකය : 0475-80-1163 )

සම්බු , මත්සුඕ , හසුණුම ප්‍රදේශය・・・සන්බුගුන්ෂි කන්ක්යෝඑඉසෙඉ කුමිඅයි
( *Sanbugunshi Kankyōeisei Kumiai* )
( දුරකථන අංකය : 0479-86-3516 )

ⓘ
■ වැඩි විස්තර දැනගැනීම සඳහා විමසීම් : පරිසර සංරක්‍ෂණ අංශය ( *Kankyō Hozenka* ) කවුළු අංක ⑯
■ දුරකථන අංකය : 0475-80-1163
■ මේ පිළිබඳ සම්බන්ධතා පිටු : 33 වෙනි පිටුවේ සිට 58 පිටුව දක්කවා

## Q13 සමාගමේ ( සේවාස්ථානයේ ) කුණු කසළ කුමන ආකාරයටඉවත දැමිය හැකිද?

**A** සමාගමේ කුණුකසළ කාර්මික අපද්‍රව්‍ය සහ සමාන්‍ය අපද්‍රව්‍ය වශයෙන් වර්ග 2 ක් ඇත.

කුමන වර්ගයකට අයත් කුණු වර්ගයක් දැයි දැනගැනීම සඳහා නගරසභා කාර්යාලයේ< පරිසර සංරක්ෂණ අංශය ( *Kankyō Hozenka*) >වෙත වාර්ථා කරන්න.

සමාගමේ කුණුකසළ ඉවත දැමීමේ ක්‍රම පහත සඳහන් දෙයාකාරයකට සිදුකලහැක.

1. අවසරලත් වෙළද සමාගම් වලට කුණු ඉවත් කිරීමමට භාර දීමේ ක්‍රම .
   අවසර ලබා නොමැති වෙළද සමාගම් වලට කුණු ඉවත් කිරීමමට භාර දීම සිදුකල නොහැක.
   අවසරලත් වෙළද සමාගම් පිළිබඳව 46 පිටුව සහ 47 පිටු ( නරුතෝ ප්‍රදේශය ) 57 වෙනි පිටුව( සම්බු , මත්සුඕ , හසුණුම ) පරීක්ෂා කර බලන්න.
2. තමන් විසින් ඉවත දැමීමේ ක්‍රම .
   කුණු කසළ තැන්පත් කර තැබීම, කුණු කසළ රැගෙන යෑම, විසිකරන ආකාරය පිළිබඳව තීරණය කර ඇත.

■ වැඩි විස්තර දැනගැනීම සඳහා විමසීම් : පරිසර සංරක්ෂණ අංශය ( *Kankyō Hozenka* ) කවුළු අංක ⑯

■ දුරකථන අංකය : 0475-80-1163

■ මේ පිළිබද සම්බන්ධතා පිටු : 33වෙනි පිටුවේ සිට 58 වෙනි පිටුව දක්වා

## Q14 වළවල් හාරා කුණුකසල පස්යට වැළලුවාට කමක් නැද්ද ?

**A** වළවල් හාරා පස්යට කුණුකසල වැළලීමට නීත්‍යානුකූලව අවසරයක් නොමැත.

අනවරසර ගොඩකිරීම් ( *Fuhotōki* ) <තීරණය කරන ලද කුණු දැමීමේ ස්ථාන නොවන ස්ථානවවලට විසිකිරීම ආදී තීරණය කර ඇති නිතිරීති අනුගමනය නොකර කුණුකසළ ඉවත් කිරීම > නීති විරෝධී

නීතියට පටහැනිව ක්‍රියාකළහොත් බන්ධනාගාර ගතවීමටහෝඒ සඳහා දඩමුදලක< මුදල් ගෙවීමක්>ඇත.

කුණුකසළ කුමන හේතුවක් සඳහහෝ වැලලීමෙන් වලකින්න.

■ වැඩි විස්තර දැනගැනීම සඳහා විමසීම් : පරිසර සංරක්ෂණ අංශය ( *Kankyō Hozenka* ) කවුළු අංක ⑯

■ දුරකථන අංකය : 0475-80-1163 පරිසර නඩත්තු අංශය

■ මේ පිළිබද සම්බන්ධතා පිටු : 33 වේ සිට 58 පිටුව දක්වා



## Q15 නිවසේ දී කුණුකසළ පිළිස්සුවාට කමක් නැද්ද ?

**A** නිවසේ ඇතුළත සහ නිවසින් පිටත කුණුකසළ සහ ගස් පිළිස්සීමට නීතියෙන් අවසර නොමැත.

නීතියට පටහැනිව ක්‍රියාකළහොත් බන්ධනාගාර ගතවීමටහෝ ඒ සඳහා දඩමුදලක් ගෙවීමට සිදුවේ.

■ දුරකථන අංකය : 0475-80-1163

■ මේ පිළිබද සම්බන්ධතා පිටු , 33 සිට 58 පිටුව දක්වා



## Q16 එදිනෙදා ජීවිතයේ දී උපදෙස් ලබාගැනීමට අවශ්‍ය වූ විට

**A** පහතසඳහන් ස්ථාන වලින් උපදෙස් ලබාගත හැක

- චිබා ජාත්‍යන්තර සම්බන්ධතා හුවමාරු මද්‍යස්ථානය (Chiba Kokusai Kōryu Senta-)

  < දුරකථන අංක > 043-297-2966

  < උපදෙස් ලබාගතහැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා වේ. ( රජයේ නිවාඩු දින හැර )

  පෙරවරු 9 යේ සිට පෙරවරු 1 2 දක්වා

  පෙරවරු 1 සිට පස්වරු 4 දක්වා කාලය

  < භාෂා> ඉංග්‍රීසි භාෂාව , ජපන් භාෂාව , චීන භාෂාව, ස්පේන් භාෂාව, තකරොඞ් , වියට්නාම භාෂාව , කොරියන් භාෂාව , නේපාල් භාෂාව , තායි භාෂාව , පෘතුගීසි භාෂාව , ඉන්දුනීසියානු භාෂාව , රුසියානු භාෂාව , හින්දි භාෂාව

  < වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම් ) >

  - එදිනෙදා ජීවිතයේ දී ( රෝහල් , පාසැල් , මහල් නිවාස , දරුවන් බිහිකිරීම , රියදුරු බලපත්‍රය රැකියා පිළිබඳව, යනාදිය )
  - නීතිමය වශයෙන් සමාජීය ප්‍රශ්ණ පිලිබදව 〔 ජපානයේ පදිංචි තත්වයේ සුදුසුකම් විසා පිළිබදව, විදේශිකයන් සමග විවාහවීම් < ජාත්‍යන්තර විවාහ >)ජපන් ජාතික විවාහයන්, දික්කසාද වීම, යනාදී නගර සභා කාර්යාලයේ සිදුකරන ලියාපදිංචි කටයුතු යනාදින්〕
  - ජපන් පන්නයේ විලාසිතාවන් සහ ජපන් සංස්කෘතික දෑ ( අසල්වාසින්න සමග සමාජ ගතවීම්, රැකියා ස්ථානයේ නීති පිළිබදව, පාරම්පරික අහාරපාන , යනාදිය )
  - සංචාරක වැඩසටහන් ( ගමනාගමනය, උද්‍යානය, කෞතිකාගාර, කළාගාර විනෝද ක්‍රීඩා උද්‍යාන, විවිධ උත්සව, ක්‍රීඩා වැඩසටහන්, ආදිය )
  - ජාත්‍යන්තර සම්බන්ධතා සඳහා විදේශීය පාඨමාලා ( ජපන් භාෂා පංති, ජාත්‍යන්තර සහ සම්බන්ධතා වැඩසටහන් ආදිය )

  < වෙබ් අඩවිය >

  https://www.pref.chiba.lg.jp/kokusai/soudan/gaikokujin/telephone.html

සන්මු නගරසභාව : 296බන්චි,තොනොදයි, සන්මුනගරය
(〒289-1392　296,Tonodai,Sammu-Shi )
විවෘර්ථව පවතින වේලාවන් : පෙරවරු8.30සිට පස්වරු5.15 දක්වා
※සෙනසුරාදා, ඉරිදා, රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.

